# 2014 – 04 – 01 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය :-**

| | | |
|---|---|---|
| 01. | **ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා** | ගරු සභාපති |
| 02. | **කමල් වැල්ලගේ මහතා** | ගරු උප සභාපති |
| **03.** | **ඒ. පී. ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය** | ගරු නගර සභා මන්ත්‍රී |
| 04. | **පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **05.** | **ග්‍රේෂන් කෙරමිණියගේ මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **06.** | **ඒ. ඩබ්. ජගත් කුමාර මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **07.** | **ජේ. ඩබ්. භාෂිනී මේනුකා විජේසූරිය මහත්මිය** | ගරු නගර සභා මන්ත්‍රී |
| **08.** | **ජේ. ඩබ්. ජයන්ත මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **09.** | **ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **10.** | **බී. ජනිත් වික්‍රමතිලක මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. 09.45 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.** ☸

**(01)**

## 01:01 2014 – 03 – 04 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

2014 – 03 – 04 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2014 – 03 – 04 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**(02)** **සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන** නැත

**(03)** **ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම**

3.1 " ලොතරැයි අලෙවි ප්‍රවර්ධන වැඩසටහන " මැයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකාරතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ජාතික ලොතරැයි මණ්ඩලය සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා එක්ව 'දොරින් දොර' නමින් අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබන බවත් එම වැඩසටහන මාස දෙකකට වරක් ඔබ ප්‍රාදේශීය සභා සභා බල ප්‍රදේශයේ සති පොලවල් ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවත් එම ආදායම කිසිදු හවුහරණක් නොමැති ජනතාවට නිවාස ලබා දීමට යොදන බවත් එම නිසා අපගේ ප්‍රචාරක රථය සඳහා බදු මුදල් අය කිරීමෙන් නිදහස් කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **අම්බලන්ගොඩ නගරයේ සති පොලවල් ක්‍රියාත්මක නොවන බැවින් මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට අවසර ලබා දිය නොහැකි බවට සභාව තීරණය කරන ලදී .**

3.2 " කොඩි කණු 20 ක් ලබා ගැනීම සඳහා " මැයෙන් ප්‍රධාන අම්බලන්ගොඩ මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014-03-21 දිනට යෙදී ඇති රණවිරු උපහාර උළෙල අම්බලන්ගොඩ පොලිස් ක්‍රීඩා පිටියේදී පැවැත්වෙන බවත් එදිනට අවශ්‍ය කොඩි කණු 20 ක් හා ප්ලාස්ටික් පුටු 200 ක් මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **රණවිරු උපහාර උළෙල සඳහා කොඩි කණු 20 ක් සහ ප්ලාස්ටික් පුටු 200 ක් මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභා අනුමැතියට යටත්ව අවසරලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

3.3 " ආදාහනාගාරය සඳහා ගෙවිය යුතු මුදල නිදහස් කර ගැනීම " මැයෙන් අම්බලන්ගොඩ ගල්දුව ආරණ්‍ය සේනාසනයේ විහාරාධිපති හිමියන් විසින් එවා තිබූ ලිපිය යෝජනා වාරයේදී ඉදිරිපත් කිරීමට සභාව තීරණය කරන ලදී.

3.4 " අංක SD/2013/137 දරණ ඉඩම් අනුබෙදුම් අයදුම්පත " සභාගත කරන ලදී.

SD/2013/137 දරණ ඉඩම් අනුබෙදුම පී. ඩබ්. ශ්‍රියා හදානි සමරදාස යන අය විසින් 6B, 6C සහ7A යන කොටස් තුනකට බෙදා තම දරුවන් හට ලබා දෙන බවත් වෙනත් පාර්ශවයකට විකිණීමක් සිදු නොවන බවත් එම නිසා 1% ගාස්තු නිදහස් කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☛ **නිවැරදිව ඉදිරිපත් කරන ලද දිව්රුම් ප්‍රකාශයක් ලබා ගෙන 6B, 6C, 7A කොටස් තුන සඳහා 1% ගාස්තු නිදහස් කිරීමටත් මෙම නම් වලින් නොවන වෙනත් නමකට හැරවීමේදී අදාල 1% ගාස්තු අය කිරීමට වරිපනම් ලේඛනයේ සඳහන් කර තැබීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

3.5 " අන්තර් සමාජ මලල ක්‍රීඩා උළෙල - 2013 " මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

25 වන යෞවන ක්‍රීඩා උළෙලේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අන්තර් යෞවන සමාජ මළල ක්‍රීඩා උළෙලේ එල්ලේ තරග පැවැත්වීම සඳහා 2014 මාර්තු 24 දින අම්බලන්ගොඩ මානාන ක්‍රීඩාපිටිය නොමිලයේ ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

තීරණය

☞ **අන්තර් යෞවන සමාජ මළල ක්‍රීඩා උළෙලේ එල්ලේ තරග පැවැත්වීම සඳහා 2014 මාර්තු 24 දින අම්බලන්ගොඩ මානාන ක්‍රීඩාපිටිය නොමිලයේ ලබා දීමට සභා අනුමැතියට යටත්ව අවසරලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

3.6 " මාර්ග කම්කරු සේවා උපහාර දැක්වීම " මැයෙන් අම්බලන්ගොඩ සෙන්ට්‍රල් සිංහ ක්ලබ් හි සභාපති විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභාවේ සේවයේ නියුතු මාර්ග ශා සෞඛ්‍ය සේවා කම්කරුවන්ට සේවා උපහාර සහතිකයක් ප්‍රධානය කිරීම හා ත්‍යාග ලබා දීම 2014-03-23 දින සවස 2.30 ට පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් ඒ සඳහා නගර ශාලාව නොමිලයේ ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **කම්කරු උපහාර දැක්වීම සඳහා 2014-03-23 දින නගර ශාලාව නොමිලයේ ලබා දීමට සභා අනුමැතියට යටත්ව අවසරලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**(04)** යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ නැත

## (05) යථා පරිදි කල්දී ඇති යෝජනා

### 5:1 ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා

**5:1:1** " ආදාහනාගාරය සඳහා ගෙවිය යුතු මුදල නිදහස් කර ගැනිම " මැයෙන් අම්බලන්ගොඩ, කහව ගල්දූව ආරණ්‍ය සේනාසනයේ විහාරාධිපති හිමියන් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදි.

ගල්දූව ආරණ්‍ය සේනාසනයේ වැඩ වාසය කල පූජ්‍ය වැලිගම අරියසිරි ස්වාමීන් වහන්සේගේ ආදාහන කටයුතු අම්බලන්ගොඩ ආදාහනාගාරයේදී සිදු කරනු ලැබූ බවත් ඒ සඳහා ආදාහනාගාරයට ගෙවිය යුතු මුදල නිදහස් කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි මීට පෙරත් ස්වාමීන් වහන්සේ නමකගේ ආදාහනය වෙනුවෙන් ආදාහනාගාරය නොමිලේ ලබා දුන්නා. මෙම ස්වාමීන් වහන්සේගේ ආදාහනය වෙනුවෙනුත් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කලින් සභා තීරණයක් අරගෙන තිබුනෙ අම්බලන්ගොඩ සීමාව තුල ස්වාමීන් වහන්සේ නමකගේ ආදාහනයක් වෙනුවෙන් සහ බද්දේගම වයෝවෘද්ධ භික්ෂු මධ්‍යස්ථානයේ සිටින භික්ෂුන් වහන්සේලාගේ අපවත්වීමක් වෙනුවෙන් පමණයි ආදාහනාගාරය නොමිලේ ලබා දීමට. එහෙමනම් සභාවෙ යෝජනාවක් කරන්න ඕනෑම ස්වාමීන් වහන්සේ නමකගේ අපවත්වීමක් වෙනුවෙන් ආදාහනාගාරය නොමිලේ ලබා දිය යුතුයි කියලා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි  අපි මේකට මීට පෙරත් සභා තීරණයක් ගත්තා. දෙල්දූව ආරණ්‍යයේ ස්වාමීන් වහන්සේ නමක් අපවත් වුන වෙලාවෙ තමයි තීරණය ගත්තෙ. මේ සභා තීරණ සොයා ගන්න බැරි එකයි ප්‍රශ්නෙ තියෙන්නෙ. ඒ තීරණ ඉක්මනින් සොයා ගන්න පුලුවන් විදියට තියන්න ක්‍රමයක් හදන්න.  එතනයි අඩුපාඩුකම තියෙන්නෙ. ඒ නිසා ලේකම්තුමා මේ තීරණ වගකිවයුතු කෙනෙකු යටතේ තියන්න පියවර ගන්න. තවත් තීරණ තියෙනව ගත්තට අද ඒව නෑ.

<u>තීරණය</u>

**මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව ඕනෑම ස්වාමීන් වහන්සේ නමකගේ ආදාහනයක් වෙනුවෙන් නගර සභා ආදාහනාගාර ගාස්තු අය කිරීමකින් තොරව ලබා දීමට සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

### 5:2 නිලධාරීන් විසින් ඉදිරිපත් කරන පරිපාලන යෝජනා :

**5:2:1** ජාතික කියවීමේ මාසය - 2013 වෙනුවෙන් දරණ ලද වියදම් සඳහා අනුමැතිය ලබා ගැනීමේ පරිපාලන යෝජනාව මැයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරී මිය විසින් ඉදිරිපත් කරන ලද පරිපාලන යෝජනාව

අම්බලන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය මගින් ජාතික කියවීමේ මාසය අරමුණු කර ගනිමින් නගර සභා බල ප්‍රදේශයේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර 2013.09.11 දින සිට 2013.09.25 දින දක්වා පවත්වන ලද තරගාවලිය සහ 2013.10.15 දින පවත්වන ලද ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානෝත්සවය වෙනුවෙන් දරණ ලද සත්‍ය වියදම පහත සඳහන් පරිදි වේ.

මෙම වියදම් දැරීම සම්බන්ධයෙන් ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි

- තරග සංවිධානය සඳහා වියදම (විනිශ්චය ගාස්තු"සංග්‍රහ,ලිපිද්‍රව්‍ය) රු. 20,037.00
- සහතික පත්,ලිපිගොනු කවර,නිල ලාංඡන, ආරාධනා පත්‍ර, දැන්වීම් පත්‍රිකා සඳහා රු. 47,055.00
- සමරු තිලිණ සඳහා රු. 12,850.00
- ඡායා රූප ඇල්බමය සඳහා රු. 8,910.00
- උත්සව දින වියදම (තොරණ නිර්මාණය,සැරසිලි, සංග්‍රහ, නර්තන ඇතුළු) රු. 69,782.50

**රු 158,634.50**

**ජාතික කියවීමේ මාසය වෙනුවෙන් දරණ ලද රු . 158,634.50 ක මුදල වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දිය යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

තීරණය

**ඒ අනුව ජාතික කියවීමේ මාසය වෙනුවෙන් දරණ ලද රු . 158,634.50 ක මුදල වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දිය යුතු බවට ඒකමතිකව සහා සම්මත විය.**

5:2:2 නොමිලේ අභ්‍යාස පොත් බෙදාදීම - 2013 වෙනුවෙන් දරණ ලද වියදම් සඳහා අනුමැතිය ලබා ගැනීමේ පරිපාලන යෝජනාව

අම්බලන්ගොඩ නගර සභාව මගින් බල ප්‍රදේශයේ පදිංචි පාසල් දරු දැරියන් 2262 ක් , නගර සභාවේ සේවයේ නියුතු නිලධාරී සේවක මහත්ම මහත්මින්ගේ දරු දැරියන් 154 ක් සහ පිරිවෙන් හි ගිහි පැවිදි සිසුන් 48 ක් වශයෙන් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2464 ක් වෙනුවෙන් 2014 වර්ෂයට අදාළව අභ්‍යාස පොත් බෙදා දීම වෙනුවෙන් දරණ ලද වියදම 2014.02.05 සභාවේ (05:02:02) යටතේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරන ලද අතර එහි අභ්‍යාස පොත් සඳහා දරණ ලද වියදම 1,810,698.00 සඳහන් කරන ලදි නමුත් සත්‍ය වියදම රු.1,854,675.00 ලෙස සංශෝධනය විය යුතුය

සංශෝධිත වියදම ඇතුළත් මුළු වියදම ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි

- අභ්‍යාස පොත් සඳහා වියදම රු. 1,810,578.00
- ඡායාරූප ඇල්බමය සඳහා රු. 15,880.00
- ප්‍රචාරණ වියදම රු. 5250.00
- වෙනත් අතිරේඛ වියදම් රු. 22,967.00

**රු 1,854,675.00**

**නොමිලේ අභ්‍යාස පොත් බෙදා දීම වෙනුවෙන් දරණ ලද රු . 1,854,675.00 මුදල වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දිය යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**<u>තීරණය</u>**

**ඒ අනුව නොමිලේ අභ්‍යාස පොත් බෙදා දීම වෙනුවෙන් දරණ ලද රු . 1,854,675.00 මුදල වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දිය යුතු බවට ඒකමතිකව සහා සම්මත විය.**

5:2:3 ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා අනුග්‍රහය ලබාදීම වෙනුවෙන් දරණ ලද වියදම් සඳහා අනුමැතිය ලබා ගැනීමේ පරිපාලන යෝජනාව

අම්බලන්ගොඩ නගර සභාව මගින් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සිසු නිපුණතා ඇගයීමේ ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානෝත්සවය සඳහා අනුග්‍රහය ලබාදීම වෙනුවෙන් දරණ ලද සත්‍ය වියදම පහත සඳහන් පරිදි වේ

මෙම වියදම් දැරීම සම්බන්ධයෙන් ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි

| | | |
|---|---|---|
| පදක්කම් සඳහා වියදම | රු. | 26,400.00 |
| ශබ්ද විකාශන පහසුකම් සඳහා | රු. | 9,000.00 |
| | **<u>රු.</u>** | **<u>35,400.00</u>** |

**ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා අනුග්‍රහය ලබාදීම වෙනුවෙන් දරණ ලද රු. 35,400.00 මුදල වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දිය යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**<u>තීරණය</u>**

**ඒ අනුව ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා අනුග්‍රහය ලබාදීම වෙනුවෙන් දරණ ලද රු. 35,400.00 මුදල වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දිය යුතු බවට ඒකමතිකව සහා සම්මත විය.**

**5:2:4 නගර ක්‍රීඩා උළෙල - 2013 වෙනුවෙන් දරණ ලද වියදම් සඳහා අනුමැතිය ලබා ගැනීමේ පරිපාලන යෝජනාව**

අම්බලන්ගොඩ නගර සභාව මගින් පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා කුසලතාවයන් ඔප් නැංවීමේ අරමුණින් ගාල්ල දිස්ත්‍රික්කයේ සියළු පාසල් සම්බන්ධ කර ගනිමින් සංවිධානය කරන නගර ක්‍රීඩා උළෙල සඳහා දරණ ලද සත්‍ය වියදම පහත සඳහන් පරිදි වේ
මෙම වියදම් දැරීම සම්බන්ධයෙන් ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි

| | | |
|---|---|---|
| ක්‍රීඩා තරග සංවිධානය සඳහා වියදම (විනිශ්චය"සංග්‍රහ …) | රු. | 54,064.60 |
| සහතික පත්,ලිපිගොනු කවර,සමරු කලාප, ආරාධනා පත්‍ර, දැන්වීම් පත්‍රිකා සඳහා | රු. | 102,200.00 |
| පදක්කම් සඳහා | රු. | 87,945.00 |

- කුසලාන සඳහා රු. 3,405.00
- ඡායා රූප ඇල්බමය සඳහා රු. 7270.00
- උත්සව දින වියදම
  (සැරසිලි, සංග්‍රහ, නර්තන ඇතුළු ) රු. 51,735.00

**<u>රු 306,619 .60</u>**

**නගර ක්‍රීඩා උළෙල වෙනුවෙන් දරණ ලද රු .306,619.60 මුදල වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දිය යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**<u>තීරණය</u>**

**ඒ අනුව නගර ක්‍රීඩා උළෙල වෙනුවෙන් දරණ ලද රු .306,619.60 මුදල වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දිය යුතු බවට ඒකමතිකව සභා සම්මත විය.**

## (06) කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1** **2014- 03- 19** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>අම්බලන්ගොඩ නගර සභාව</u>**

**<u>කළමනාකරණ කමිටු වාර්තාව</u>**

| | | | |
|---|---|---|---|
| **දිනය** | : | **2014.03.19** | |
| **ස්ථානය** | : | **නගර සභාව, අම්බලන්ගොඩ** | |
| **වේලාව** | : | **පෙ.ව. 10.00** | |
| **සහභාගීත්වය** | : | **කමල් වැල්ලගේ මයා** | **- සභාපති** |
| | | **භාරත සමරසේකර මයා** | **- ලේකම්** |
| | | **ඩී. ඩබ්. පත්මසිරි මයා** | **- ගණකාධිකාරී** |
| | | **එම්. ඩබ්. සිසිර කුමාර මයා** | **- කර්මාන් අධිකාරී** |
| | | **එම්.පී.ආර්. පුෂ්පකුමාර මයා** | **- සංවර්ධන සහකාර** |
| | | **සි.පී.ඩී. වරාගොඩ මිය** | **- කළමනාකරණ සහකාර** |
| | | **කේ. සී. සී. ප්‍රනාන්දු මිය** | **- අභ්‍යන්තර විගණන නිලධාරී** |
| | | **ඩබ්.පී. සිල්වා මිය** | **- සංවර්ධන නිළධාරී** |
| | | **මානෙල් රංජනි මෙය** | **- පුස්තකාලයාධිපති** |
| | | **පී.එම් ටී විමලධර්ම මෙය** | **- සංවර්ධන නිළධාරී** |
| | | **ඩබ්.එම්.යූ. මහිමා දයාරත්න මිය** | **- කළමනාකරණ සහකාර** |

01. **පිළිගැනීම.**

- සියලු දෙනාම කළමනාකරණ කමිටුවට සාදරයෙන් පිළිගන්නවා. - **ලේකම්**

**ආයතන අංශය පිළිබදව සාකච්ඡා කිරීම**

- අප අංශයට ලිපි ද්‍රව්‍ය ලැබ් නොමැති බැවින් කාර්යන් ඉටු කිරිමේ අපහසුතත්වයකට පත්ව ඇත. එම නිසා මෙම ද්‍රව්‍ය ඉක්මනින් ලැබෙන්න සලස්වන ලෙස ඉල්ලා සිටින අතර වෙනත් කිසිදු ගැටළුවක් නොමැත. - **පුෂ්පකුමාර මයා**

- එක් එක් අංශයන්ට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය අංශ ප්‍රධානින් හරහා ඉල්ලුම් කරන්න කියා ලිපියක් මගින් දැණුම් දුන්නත් තවම කිසිකෙනෙක් කිසිදු ඉල්ලීමක් කර නොමැත. ඉල්ලීමක් කරන්නැතුව භාණ්ඩ හා උපකරණ ගෙන්වීමට ගබඩා භාරකරුට අයිතියක් නොමැති බවත් එක් එක් අංශයන්ට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මොනවාද? කොපමණ ප්‍රමාණක් අවශද? යන්න නොදන්නා බවත් පෙන්වා දෙන ලදි. -**ගණකාධිකාරී**

- **තිරණය - සෑම අංශයක්ම ඉදිරි මාස තුනට අදාළ ලිපි ද්‍රව්‍ය අංශ ප්‍රධානින් හරහා ඉල්ලුම් කර යුතු බවත්, එම ඉල්ලීම සති දෙකකට පෙර ඉල්ලිය යුතු එහිදී එම සති දෙක තුලදී ලිපි ද්‍රව්‍ය ගෙන්වා ගැනිමට හැකිවේ.**

**ආදායම් අංශය පිළිබදව සාකච්ඡා කිරීම**

- ක්‍රීඩා භූමිය වෙන් කිරිමේදි ප්‍රශ්න කිහිපයක්ම අද ආවා, එක දිගටම නගර සභා ක්‍රීඩා ලෙස ක්‍රීඩා භූමිය වෙන් කර තිබෙන බවත් සමහර අවස්ථාවලදි වෙන් කර දවස් වෙනත් අයට ලබා දි ඇති අවස්ථාද දක්නට ලැබෙන බව හා ඊට හේතුව කුමක් ද? යන්න විමසන ලදි. -**සභාපති**

- ක්‍රීඩා උපදේශක ඇවිත් පොත ගෙන එයාට අවශ්‍ය දවස් වෙන් කරන බවත් එය කාලයක් තිස්සේ සිදුවන බවත් මෙයට විසදුමක් ලබා දෙන ලෙසත් ප්‍රකාශ කරන ලදි. -**වරාගොඩ මිය**

- **තිරණය - නගර ක්‍රීඩා සදහා ක්‍රීඩා භූමිය වෙන් කිරිමෙදි එය ලිඛිතව සභාපති, ලේකම්ගේ අනුමැතිය ගෙන ක්‍රීඩා භූමිය වෙන් කළයුතු බවට තිරණය විය.**

**ගිණුම අංශය පිළිබදව සාකච්ඡා කිරීම**

- ගිය කළමණාකරන කමිටුවේ කතාකර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් එවන ලද ලිපියට පිලිතුරු සභාවට යොමු කර සභා තිරණය සමග පාලන සහකාර කොමසාරිස්ට පිටපතක් සහිතව පිලිතුරු යැව්ව බවත් පසුව අප යැව්ව පිලිතුර පිලිබදව දැනුවත් කිරිම සදහා විමර්ෂණ නිළධාරියාව ඇතුලු අංශ ප්‍රධානින් එක්ව කෙටි සාකච්චාවක් සිදු කළ බවත් නමුත් විමර්ෂණ නිළධාරියා සම්බන්ධ කර ගැනිමට නොහැකි වු බවත් අපට ඉදිරියට කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය බැවින් අප ආයතනයෙ අංශ ප්‍රධානින් එක්ව තිරණයකට එළඹුණා සෞඛ්‍ය, කර්මාන්ත, පුස්තකාල, යන අංශ සදහා දල ඇස්තමේන්තුවක් සහිතව රු 5000 ක තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබා දෙනවා.

- ගිය කළමණාකරන කමිටුවේදිත් කතා කළ අවසන් ගිණුම් විගණන දෙපාර්තුමේන්තුවට 2014.03.31 ට පෙර යැවිය යුතු බවත් එහෙත් අද වනතේක් එම වාර්තාව සකස් කිරිමට අවශ්‍ය තොරතුරු ලැබ් නොමැත.අදාල විශය භාර නිළධාරිනියගෙන්වා දැනුවත් කර විට ඇය සතියක් ඇතුලත දෙන්නම් කිවත් තවම ලැබ් නැත, මේ පිලිබදව වාර්තාවක් ඉල්ලුවද තවමත් එයත් ලැබ් නොමැත. අවසන් ගිණුමට වාර්තා ලබා දිමේදි එය අදාළ දිනයට යොමු නොකරන විට කාර්ය සාධන ලකුණු අඩුවිමක්ද සිදුවේ.

- අපේ ආදායම වියදමට ප්‍රමාණවත් නොවේ මෙය තවදුරටත් ඉවසා සිටිය නොහැක මිනිස්සු දුරකතනයෙන් හා කාර්යාලයට ඇවිත් මට දෝෂාරෝපනය කරනවා නිකරුනේ මම බැනුම් අහනවා. මෙම මුදල් ගෙවන්න මට ගෙදරින් ගෙන්න බැ මෙම තත්වටය කඩිනමින් විසදුම් සෙවිය යුතුයි.

- පරිගණක පැකේජය තවමත් කටයුතු කරන්නේ ආදායම් අංශයේ පමණයි තවමත් ගිණුම් අංශය පිළිබදව කටයුතු කර නොමැත දැන් තත්වය කේබදුද වාම් මියගෙන් විමසිය -**ගණකාධිකාරී**

❖ වයඹ කට්ටියේ රැයේ ඇවිත් ආයේත් අලුත් පැකේජයක් දැම්මා එය කැගල්ලේ නගර සභාට විසින් භාවිතා කරන පරිගණක පැකේජය එම නිසා මට ආයෙත් ගිය මාස තුන ඇතුලත දාපු දත්ත නැවතත් ඇතුලත් කරන්න වෙනවා. මෙම පැකේජය දැම්මට හේතුව වුයේ සියලුම නිළධාරින් බිල් කැඩුවත් මාසේ අවසානයේ එකතුවක් ගැනිමට නොහැකි විමයි. තවමත් නිසියාකාරව කටයුතු කරගෙන යාමට අපහසු තත්වයක් පවතින බව ප්‍රකාශකරන ලදි. -**වරාගොඩ මිය**

❖ පරිගණක පැකේජයේ අපේ පැත්තේන් ඉටුවියයුතු දේ ඉටු වුවද තවමත් වයඹ පැත්තේන් යම් යම් අඩුපාඩු දැකිය හැකිය. මෙම අවුරුද්දේ අත්හදා බැලිමෙ කාලයක් ලෙස යොදාගන්න වෙන බව ප්‍රකාශකරන ලදි. -**ගණකාධිකාරී**

❖ ගණකාධිකාරිතුමා විසින් කළමණාකරන වාර්තාවට යොමු කිරිමට සඳහා වාර්තටවක් සපයන ලදි. එම වාර්තාව අමුණා ඇත.

**කර්මාන්ත අංශය පිළිබඳව සාකච්ජා කිරිම**

❖ විදිහන් පහන් අලුත් වැඩියා කිරිම සඳහා රු 7ක් වැනි ඉතා සුළු මුදලක් වැය වන්නේ එය අප ආයතනයේ නිළධාරින්ට කළ හැකි බවත් එය ඉටුකර හැකිනම් වඩාත් සුදුසු බව බව ප්‍රකාශකරන ලදි.

❖ අවශ්‍ය උපකරන ලබාදි එය ඉටු කරන්න. කර්මාන්ත අංශයේ සේවකයින්ගේ රජකාරි හරියට ඉටුවෙකවද? ඔහුන්ට හිතන හිතන වේලාවන්ට වෙනත් කටයුතු කරන බවත් පෙනි යනවා ඔහුන්ගේ කාර්යන් පිළිබදව වාර්තාවක් අවශ්‍ය බව ප්‍රකාශකරන ලදි. -**සභාපති**

❖ **තිරණය - කර්මාන්ත හා සෞඛ්‍ය අංශ වල සේවකයින් විසින් සිදුකරන කාර්යන් පිළිබදව වාර්තාවක් සපයන ලෙස වැඩ අධිකාරිව දැණුවත් කරන ලෙස තිරණය විය.**

**පුස්තකාල අංශය පිළිබඳව සාකච්ජා කිරීම**

❖ වැඩකටයුතු කෙරගෙන යන බවත් විශේෂ ප්‍රශ්ණයක් නොමැති බව ප්‍රකාශකරන ලදි. -**පුස්තකාලයාධිපති**

**02. රැස්විමේ වැඩ කටයුතු අවසන් කිරිම.**

❖ ස්තුති කථාව කිරිම සහ රැස්විමේ වැඩ කටයුතු අවසන් කිරිම. -**ලේකම්**

සකස් කළේ :පි.එම් ටි විමලධර්ම (සංවර්ධන සහකාර)

ගණකාධිකාරි තුමා විසින් ඉදිරි පත් කළ වාර්තාව :

සභාපතිතුමා /
ලේකම්තුමා

1. 2014.03.12 දිනට අම්බලන්ගොඩ නගර සභාව නොගෙවු වව්වර පිළිබද විස්තර උපලේඛණ 03 හි යා

කර ඇත එහි සාරාංශය පහත දැක්වේ

1 -වගුව (ආසන්න රුපියලට)

| විස්තරය | මාස 12‹6 | මාස 6 ට අඩු | එකතුව |
|---|---|---|---|
| i. නොගෙවු වව්වර් (ණය හිමියෝ) | 176687.00 | 3577841.00 | 3754528.00 |
| ii. නොගෙවු වව්වර් (ඉන්ධන) | | 314742.00 | 314742.00 |
| එකතුව- ණය හිමියෝ | **176687.00** | **3892583.00** | **4069270.00** |

2. 2013.12.31 දිනට දිගු කාලින ණය ශේෂ සාරාංශය විස්තර උපලේඛණ 01හා 02 හි සදහන් කර ඇත .

1 -වගුව (ආසන්න රුපියලට)

| ණය ලබා ගත් කාරණය | ණය ලබා ගත් දිනය | ණය කාලය අවුරුදු | ලබා ගත් ණය මුදල (රු) | 2013.12.31 දිනට ශේෂය (රු) | |
|---|---|---|---|---|---|
| | | | | වාරික | පොලිය |
| (අ) දේ. K. ස. අ. | | | | | |
| සප්පු සංකීර්ණය | 1990.01.05 | 25 | 1000000.00 | 600000.00 | 794200.00 |
| ආදාහනාගාරය | 1998.01.05 | 12 | 1800000.00 | 1125000.00 | 1765125.00 |
| ප්‍රසිද්ධ වැසිකිළි 3 | 2004.09.30 | 16 | 805991.00 | 805991.00 | 487538.00 |
| ගලි රථය | 2002.08 | 18 | 2102447.00 | 1209103.00 | |
| (අ) එකතුව | | | **5708438.00** | **3740094.00** | **3046863.00** |
| (ආ) නා. ස. අ. | | | | | |
| ට්‍රැක්ටර් 3 | 1998.04 | 22 | 1200463.00 | 1200463.00 | |
| ට්‍රේලර් 3 | 1998.06 | 22 | 115200.00 | 115200.00 | |
| බස් නැවතුම් පේළ ව්‍යපෘ | 1998.07.04 | 22 | 32994174.00 | 32542135.00 | |
| (ආ) එකතුව | | | **34309837.00** | **33857798** | |
| (අ) සහ (ආ) එකතුව | | | **40018275.00** | **37597892.00** | |

ඉහත 1 වගුව අනුව 2014.03.12 දිනට ගෙවිය යුතු වව්චර් වල (ණය හිමියෝ) එකතුව රුපියල් 4069270.00 කි සභාවේ ආදායම සෑම මසකම

i. ආදේශක වැටුප් හා දීමනා

ii. ඉන්ධන බිල්පත්

iii. විදුලිය හා ජලය

iv. දුරකථන බිල්පත්

ගෙවීම් කල පසු ඉතිරි මුදල ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන සභාවේ ණය හිමි ප්‍රමාණය දිගින් දිගටම වර්ධනය වන ඇත. මෙම තත්වය හමුවේ ව්‍යපාරික ප්‍රජාව නගර සභාව කෙරේ පවත්නා විශ්වාසය කඩවීම හේතු කොට ගෙන ණය පදනම යටතේ භාණ්ඩ ලබා දීමට කැමති නොවේ මෙම තත්වය රාජකාරී කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමට බාධාවකි මෙම තත්වය මග හරවා ගැනීමට කරනු ලබන යෝජනා

i.මාසික කඩ කුලී ආදායමෙන් ⅓ ක් නගර අලංකාර ගිණුමට වෙන් කිරීම නතර කිරීම

( මෙය සභා අනුමැතිය අනුව කල යුතුය)

ii.මුද්දර ආදායමෙන් 25 % ක් පොදු ගිණුමට ගිණුම් ගත කිරීම

3. 2 වගුවේ සදහන් ණය මුදල් බේරුම් කිරීම (ගලි රථය හැර ) දිගින් දිගටම ප්‍රමාද වී ඇත ඊට හේතුව සභාවේ ආදායම ප්‍රමාණවත් නොවීමයි මෙම තත්වය මග හරවා ගැනීම සදහා කරනු ලබන යෝජනා

i. ලැබෙන මුද්දර ආදායමෙන් 25 % ක් යෙදවීම

ii. හිග වරිපනම් ආදායම් එකතු කර ගැනීම (වෙනත් හිග ආදායම් සමග )

අම්බලන්ගොඩ නගර සභාව ලබා ගෙන ඇති දිගු කාලාන ණය

(අ) දේශිය ණය සංවර්ධන අරමුදල

| ණය ලබා ගත් කාරණය | | ණය ලබාගත් දිනය | මුල් ණය මුදල | ණය වාරික හා පොලිය බේරුම් කළ අවසාන දිනය ණය වාරික පොලිය | | 2013,12,31 දිනට ශේෂය | | | පරිණත දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | වාරික | පොළිය | එකතුව | |
| සාජ්පු සංකීර්ණය | | 1990,01,15 | 1,000,000.00 | 2000 වරෂය | 2000 වරර්ෂය | 600000.00 | 794200.00 | 1394200.00 | 2015.01.14 |
| ආදාහනාගාරය | අවු:12 | 1998,01,15 | 1,800,000.00 | 2004 ii කාර්තුව | 2012.09.26 | 1765125.00 | 1765125.00 | 2890125.00 | 2010.01.14 |
| | | | | 2012.12.26 | | | | | |
| ගලි රථය | අවු:18 | 2008,08 | 2,102,447.36 | 2013 iv කාර්තුව | 2013.12.31 | 12.9103.49 | නැත | 1209103.49 | 2020.08 |
| ප්‍රසිද්ධ වැසිකිලි පද්ධතිය | අවු:16 | 2004,09,30 | 805,990.74 | ගෙවා නැත | ගෙවා නැත | 805990.74 | 487537.78 | 1293528.52 | 2020.09.29 |
| එකතුව | | | **5,708,438.10** | | | **3740094.23** | **3046862.78** | **6786957.01** | |

(ආ) නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබා ගත් ණය

| ණය ලබා ගත් කාරණය | ණය කාලය | ණය ලබාගත් දිනය | මුල් ණය මුදල | ණය වාරික හා පොලිය බේරුම් කළ අවසාන දිනය ණය වාරික පොලිය | | 2013,12,31 දිනට ශේෂය | | | පරිණත දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | වාරික | පොළිය | එකතුව | |
| ට්‍රැක්ටර් 3 | අවු : 22 | 1998.04 | 1,200,463.20 | 2000 වර්ෂය | 2000 වර්ෂය | 1200463.20 | 1326505.00 | 2526968.20 | 2020.04 |
| ට්‍රේලර් 3 | අවු : 22 | 1998.06 | 115,200.00 | 2000 වර්ෂය | 2000 වර්ෂය | 115200.00 | 129032.00 | 244232.00 | 2020.06 |
| බස් නැවතුම් පොළ | අවු : 22 | 1998.07.14 | 32,994,174.00 | 2004.06 | 2004.06 | 32542134.77 | 35380963.51 | 67923098.28 | 2020.07.13 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය | | | | | | | | | |
| එකතුව | | | 34.309,837.20 | | | 33857797.97 | 36836500.51 | 70694298.48 | |

උපලේඛණ 01 සහ උපලේඛණ 02 එකතුව - **77481255.49**

උපලේඛණ 01 සහ උපලේඛණ 02 එකතුව - **77481255.49**

| නොගෙවූ වව්චර් පිළිබඳ විස්තර | 2014.03.12 දිනට | | | |
|---|---|---|---|---|
| දිනය | නම | අවු 1 -මාස 6 ත් අතර | මාස 6 ට අඩු | ගෙවූ දිනය |
| 2013.04.29 | D Samsons & PVT Ltd | 51536.90 | | |
| 2013.05.10 | Richerd Peeris Distributors | 72000 | | |
| 2013.08.12 | Softlogic show room | 36875.00 | | |
| 2013.08.26 | Ambalangoda Coparative | 4550.00 | | |
| 2013.09.03 | Diamond Advertising | 1800.00 | | |
| 2013.09.06 | Ambalangoda Coparative | 5385.00 | | |
| 2013.09.13 | Ambalangoda Coparative | 4540.00 | | |
| 2013.10.14 | The Associated Newspapers Ceylon Limited | | 8064.00 | |
| 2013.11.01 | Sri lanka Insurance Coparation Limited | | 14987.20 | |
| 2013.11.01 | Sri lanka Insurance Coparation Limited | | 14987.20 | |
| 2013.11.01 | Sri lanka Insurance Coparation Limited | | 14987.20 | |
| 2013.11.01 | Sri lanka Insurance Coparation Limited | | 14987.20 | |
| 2013.11.01 | Sri lanka Insurance Coparation Limited | | 14987.20 | |
| 2013.11.01 | Sri lanka Insurance Coparation Limited | | 14987.20 | |
| 2013.11.01 | Sri lanka Insurance Coparation Limited | | 6441.49 | |
| 2013.11.11 | Ambalangoda Coparative | | 4500.00 | |
| 2013.12.05 | Nalani Arumapperuma | | 35000.00 | |
| 2013.12.09 | Diamond Advertising | | 2720.00 | |
| 2013.12.09 | Nalani Arumapperuma | | 35000.00 | |
| 2013.12.20 | The Associated Newspapers Ceylon Limited | | 70560.00 | |
| 2013.12.23 | National Engineering Research & Devolopment | | 458285.72 | |
| 2014.01.10 | Rathna Motors PVT Ltd | | 117200.00 | |
| 2014.01.10 | Tulip Computers | | 72400.00 | |
| 2014.01.10 | Indunil hardware | | 51679.00 | |
| 2014.01.10 | Dishan & Dishani | | 23700.00 | |
| 2014.01.10 | Chamara Industries | | 42138.00 | |
| 2014.01.21 | Diamond Advertising | | 960.00 | |
| 2014.01.21 | Chamara Industries | | 861800.00 | |
| 2014.01.21 | Chamara Industries | | 381978.00 | |
| 2014.01.21 | Chamara Industries | | 566800.00 | |
| 2014.02.05 | Ambalangoda Coparative | | 19100.00 | |
| 2014.02.17 | M.S Weerasingha | | 38415.00 | |
| 2014.02.24 | Grack computer forms pvt ltd | | 35000.00 | |
| 2014.02.26 | Tulip Computers | | 204900.00 | |
| 2014.02.20 | Wiscom concreate Works | | 13440.00 | |
| 2014.02.24 | Sri lanka Insurance | | 27024.92 | |
| 2014.02.24 | Pathma furniture | | 21000.00 | |

| | | | | |
|---|---|---|---|---|
| 2014.02.24 | A.W Fareeda | | 357.00 | |
| 2014.02.24 | H.H.R de Silva | | 979.00 | |
| 2014.02.24 | H.H.R de Silva | | 720.00 | |
| 2014.02.24 | H.H.R de Silva | | 680.00 | |
| 2014.02.24 | H.H.R de Silva | | 800.00 | |
| 2014.02.24 | Mallika Industries | | 500.00 | |
| 2014.03.05 | Udaya pusha Distributors | | 46025.00 | |
| 2014.03.05 | Udaya pusha Distributors | | 57946.00 | |
| 2014.03.12 | Sakva Printers | | 27150.00 | |
| 2014.03.12 | M.G de Silva | | 57920.00 | |
| 2014.03.12 | Lankem Ceylon PLC | | 103600.00 | |
| 2014.03.12 | A.P Rajapaksha | | 32610.00 | |
| 2014.03.12 | Nestre Works | | 6000.00 | |
| 2014.03.12 | SPC | | 54525.00 | |
| | | **176686.90** | **3577841.33** | |

**2014.03.12** දිනට නොගෙවූ බිල්පත් ගෙවීම් විස්තර

| දිනය | නම | වටිනාකම | ගෙවූ දිනය |
|---|---|---|---|
| 2014.02.05 | Ambalangoda Coparative- 2014 January 01-15 | 94016.20 | |
| 2014.02.25 | Ambalangoda Coparative -2014 january 15-31 | 139225.90 | |
| 2014.03.06 | Ambalangoda Coparative -2014 February 01-15 | 81499.60 | |
| | | **314741.70** | |

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මෙම වාර්තාවේ යෝජනා කර තිබෙනවා මුද්දර ගාස්තු වලින් 25% පමණ මුදලක් ණය බේරුම් කිරීම සඳහා යොදා ගැනීමට.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගණකාධිකාරී මහතා, ඔබලාට වරිපනම් ආදායම ලක්ෂ 70 කුත් කඩකුලී ආදායම ලක්ෂ 100 කුත් නගර සභාවේ ඉතුරු පරිපාලන කටයුතු කිරීම සඳහා ලබා දීල තියෙනවා. අපිට මන්ත්‍රීවරු වශයෙන් මෙතන වාඩි වෙලා වැඩ කරන්න තියෙන්නෙ ඔය මුදල් ටික විතරයි. ඒකත් තෙල් ගහන්නයි අතිකාල ගෙවන්නයි ගියොත් අපි මෙතන මාසෙකට සැරයක් රැස්වෙන එකෙනුත් වැඩක් නැති වෙනවා. අපි මෙතෙන්ට ඇවිල්ල තියෙන්නෙ මිනිස්සුන්ට වැඩක් කරන්න. ඒ නිසා පුලුවන් තරම් වියදම් ඒතුල සීමා කර ගන්න. ඒ නිසා සභා තීන්දුවක් දෙන්න අමාරුයි අවශ්‍ය වන විදියට සලකා බලමු.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි කළමනාකරණ කමිටුවෙදි මේ ගැන කතා වුනා. ඇත්තටම ගණකාධිකාරීතුමා ප්‍රකාශ කර පරිදි අවුරුද්දට වැඩි ණය හිමියන් පවා ඉන්නවා. ඒ අයගෙ ඉවසීමෙ සීමාව ඉක්මවා යන අවස්ථාත් තියෙනවා. එහෙම වුනොත් සභාවෙ ගරුත්වයත් නැති වෙනවා. ඒ නිසා සභාපතිතුමනි මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඉක්මනින්ම මේ සඳහා සුදුසු පිලියමක් ගන්නා ලෙස.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මම මේ වාර්තාව ගැන අධ්‍යයනයක් කරන්නම්. අධ්‍යයනය කරල පිළිතුරක් ලබා දෙන්නම්.

**තීරණය**

මෙම යෝජනාව සම්බන්ධයෙන් ලබන සභා වාරයේදී තීරණයක් ගැනීමට සභාව තීරණය කරන ලදී.

**ඒ අනුව 2014 -03- 19 දින පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

- **පෙ. ව. 10.05 ට පමණ ගරු නගර සා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා සභාවට පැමිණෙන ලදී.**

**6: 2** **2014- 03- 24** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් විසින් ස්ථිර කරන ලදී.

**ක්‍රීඩා කමිටු රැස්වීම - 2014.03.24**

සහභාගීත්වය

| | | |
|---|---|---|
| කමල් වැල්ලගේ මහතා | - | ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව. |
| භාරත සමරසේකර මහතා | - | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව. |
| කසුන් ගාල්ලගේ මහතා | - | ක්‍රීඩා නිලධාරි |
| එස්.කේ.පත්මසිරි මහතා | - | ඩොල්ෆින් ජල ක්‍රීඩා සමාජය |
| සුගත් හෙට්ටි ආරච්චි මහතා | - | ක්‍රීඩා කමිටු සාමාජික |
| කේ.ජේ.තාබ්‍රෙව් මහතා | - | රියෝ ක්‍රීඩා සමාජය |
| මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා | - | ක්‍රීඩා කමිටු සමාජික |
| ඩී.වී.තරංගි මිය | - | ප්‍රජා සංවර්ධන නිලධාරි, අම්බලන්ගොඩ නගර සභාව. |

**පිළිගැනීම - ගරු සභාපති කමල් වැල්ලගේ මහතා**

ක්‍රීඩා කමිටු රැස්වීම සඳහා පැමිණි ක්‍රීඩා නිලධාරි මහතා , ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් පැමිණි නිලධාරි මහතුන් , ක්‍රීඩා කමිටු සමාජික මහතුන් තම වටිනා කාලය කැප කරමින් මෙම අවස්ථාවට සහභාගි වීම සම්බන්ධයෙන් සතුටට පත්වන අතර ඉතා ගෞරවයෙන් පිළිගන්නා බව ප්‍රකාශ කරන ලදී.

නගර සභාව නියෝජනය කරමින් මෙම කමිටුවට සහභාගි විය යුතු ක්‍රීඩා භූමි උපදේශක, ක්‍රීඩා භූමි භාරකරු නොපැමිණීම සම්බන්ධයෙන් තම අප්‍රසාදය පළ කරන බවත් ඔවුන් අනිවාර්යයෙන්ම මේ සඳහා සහභාගි විය යුතු බවත් එසේ නොමැතිව මෙම කමිටුවේ දී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමේ දී ගැටළු පැන නගින බව පෙන්වා දෙමින් අද දින ක්‍රීඩා කමිටුව නොපවත්වන බවත් ඉදිරියේ දී මෙම කමිටුව රැස්කිරීමේ දී අදාළ නිළධාරීන් ද සහභාගි කිරීමට කටයුතු කරන ලෙසට ලේකම් මහතා දැනුවත් කරමින් කමිටුව කල් තබන ලදී.

ක්‍රීඩා නිලධාරි කසුන් ගාල්ලගේ මහතා විසින් ලිපි තුනක් ඉදිරිපත් කරන ලද අතර අදාළ ලිපි ගරු සභාව සඳහා ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දෙන ලදී.

**එස්.කේ. පත්මසිරි මහතා විසින් RULES OF THE GAME සහ NOTHROP TIGERSHARKS SWIM CLUB MANUAL & GUIDE යන කෘති දෙක නගර සභාවට පරිත්‍යාග කරන ලදී.**

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි මෙම කමිටුව මම කල් තිබ්බා. මොකද නගර සභාවෙ ක්‍රීඩාවට සම්බන්ධ නිලධාරීන් මෙම කමිටුවට සම්බන්ධ වෙන්නෙ නැත්තම් මේ කමිටුව පැවැත්වීමේ තේරුමක් නැහැ. ක්‍රීඩා භූමි භාරකරු සහ ක්‍රීඩා උපදේශක යන

දෙදෙනාම මේ කමිටුවට සහභාගි වුනේ නැහැ. ඇත්තටම ඉතාම කණගාටුදායකයි මේ තත්වය. මොවුන්ට දුරකථනයෙන් කතා කරලත් කියනවලු. ඒත් ඉතින් මේ නිලධාරීන් මේවට සහභාගි වෙන්නෙ නැහැ. මෙහෙම ගියොත් මේ කමිටුවල තියෙන ගරුත්වයත් නැතුව යනවා.

__තීරණය__

**මෙම නිලධාරීන් කමිටුවට නොපැමිණීම සම්බන්ධයෙන් ලිඛිතව හේතු විමසීමට සභාව තීරණය කරන ලදී**

__ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්__

සභාපතිතුමනි ඒවගේම ක්‍රීඩා භූමිය වෙන් කරනව නම් ඒ ක්‍රීඩා භූමිය වෙන් කිරීමේදී ලේකම් තුමා හෝ සභාපතිතුමා මැදිහත් වෙන්න ඕනෙ. මට එක් පුද්ගලයෙක් දීපු ලියුමක් තියෙනවා. මම ඒක ඉදිරිපත් කරන්නෙ නැහැ. මේ නිලධාරීන් ක්‍රීඩා පිට්ටනිය දිගටම වෙන් කරගෙන. නගර සභා ක්‍රිකට් කියල දිගටම ලියලා. එක පුද්ගලයෙක් ආව 6 වෙනිදට වෙන් කරන්න. දෙන්න බැහැ කිව්ව. නගර සභා ක්‍රිකට් කියල ලියපු නිසා. ඒ පුද්ගලය ආයෙමත් දවසක ආවම ඒ දිනය වෙන කෙනෙකුට දීල. නිලධාරීන්ට ඕන විදියට මේ සභාව පාලනය කරනව නම් අපි මේ දොළොස් දෙනෙක් මෙතන්ට එන්න ඕනෙ නැහැනෙ සභාපතිතුමනි. පොල්වත්තෙ මිනිස්සුන්ට ඒගොල්ලන්ගෙ අවුරුදු උත්සවයට පිට්ටනිය දෙන්න ඕනෙ. දැන් වෙලා තියෙන්නෙ ඒ අයට අපි හරහා එන්න ඕනෙ පිට්ටනිය වෙන් කර ගන්න. මේව කිව්වම ක්‍රිකට් ඇකඩමියෙ දෙමව්පියෝ මගෙන් අහනව ඇයි මෙහෙම කරන්නෙ කියලා. අපිට මේවට උත්තර දෙන්න ඕනෙ නැහැ. අපි මේ මහජනතාවගෙ ඡන්දෙන් පත්වෙලා ඇවිල්ල තියෙන්නෙ. මම ඉල්ලා සිටිනවා සභාපතිතුමනි එහෙම වෙන්න ඉඩ දෙන්න එපා කියලා.

__ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

නගර සභා ක්‍රිකට් ඇකඩමියටයි පාපන්දු සංචිතයටයි ලිඛිතවම දැනුම් දෙන්න ඒ අවශ්‍ය දිනයන් කලින් සභාව දැනුවත් කරල වෙන් කිරීම් කරගන්න කියලා. පොතේ ලියන්න එපා නිකම්ම. සභා තීන්දුවක් තියෙන්න ඕනෙ. දැන් මේ කියන කතාව සාධාරණයි. පොල්වත්තෙ මිනිස්සුන්ට තමන්ගෙ අවුරුදු උත්සවය දවසට පිට්ටනිය දෙන්නෙ නැත්තම් ඒක හරි ප්‍රශ්නයක්. පොල්වත්තෙම මිනිස්සු තමයි මේ පිට්ටනිය පරිත්‍යාග කරල තියෙන්නෙ. අපි වෙන දෙයක් නවත්තල හරි ඒ අයට දෙන්න ඕනෙ.

__තීරණය__

**නගර සභා ක්‍රිකට් ඇකඩමිය සහ නගර සභා පාපන්දු සංචිතය වෙනුවෙන් ක්‍රීඩාංගණ සඳහා අවශ්‍ය දින වෙන් කිරීමේදී සභා අනුමැතියක් ලබා ගෙන දින වෙන් කිරීම් කල යුතු බවට සභාව තීරණය කරන ලදී.**

__ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

එස්. කේ. පද්මසිරි මහතා විසින් ක්‍රීඩාවට සමබන්ධ කෘතීන් දෙකක් පරිත්‍යාග කරල තියෙනවා. මේක පිටපතක් ගහල පුස්තකාලයේ තියන්න. ඇත්තටම මේක වැදගත් දෙයක්. ඒම හත්මයට ස්තුති කරල ලිපියක් යවන්න.

__තීරණය__

**ක්‍රීඩාවට සමබන්ධ කෘතීන් දෙකක් පරිත්‍යාග කිරීම සම්බන්ධව එස්. කේ. පද්මසිරි මහතාට ස්තුතිකර ලිපියක් යැවීමට සභාව තීරණය කරන ලදී.**

**ඒ අනුව 2014 -03- 24 දින පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2: 1** ‘ 40 වන ජාතික මහා ක්‍රීඩා උළෙල දෙවන අදියර - ගාල්ල දිස්ත්‍රික් තරග’ මැයෙන් ගාල්ල දිස්ත්‍රික් දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

40 වන ජාතික මහා ක්‍රීඩා උළෙලට සමගාමීව පවත්වන ගාල්ල දිස්ත්‍රික් ක්‍රිකට් තරග 2014- 05- 11 දින පොල්වත්ත නගර සභා ක්‍රීඩාංගණයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් ඒස ඳහා එම ක්‍රීඩාංගණය මුදල් අය කිරීමකින් තොරව ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ක්‍රිකට් තරග තියෙන්නෙ අවුරුදු 13 අඩු අයගෙ නම් විතරක් පොල්වත්ත ක්‍රීඩාංගණය දෙන්න. නැත්නම් නගර සභා ක්‍රීඩාංගණය දෙන්න.

<u>තීරණය</u>

☞ **2014- 05- 11 දින ගාල්ල දිස්ත්‍රික් ක්‍රිකට් තරග පැවැත්වීම සඳහා වයස අවුරුදු 13 ට අඩු නම් පොල්වත්ත ක්‍රීඩාංගණය මුදල් අය කිරීමකින් තොරව ලබා දීමටත් වයස අවුරුදු 13 ට වැඩි නම් නගර සභා මහජන ක්‍රීඩාංගණය මුදල් අය කිරීමකින් තොරව ලබා දීමටත් සභාව තීරණය කරන ලදී .**

**6: 2: 2** ‘ 40 වන ජාතික මහා ක්‍රීඩා උළෙල දෙවන අදියර - ගාල්ල දිස්ත්‍රික් තරග’ මැයෙන් ගාල්ල දිස්ත්‍රික් දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

40 වන ජාතික මහා ක්‍රීඩා උළෙලට සමගාමීව පවත්වන ගාල්ල දිස්ත්‍රික් පාපන්දු තරග 2014- 05- 24 දින නගර සභා ක්‍රීඩාංගණයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් ඒ සඳහා එම ක්‍රීඩාංගණය මුදල් අය කිරීමකින් තොරව ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **2014- 05- 24 දින නගර සභා ක්‍රීඩාංගණය ගාල්ල දිස්ත්‍රික් පාපන්දු තරග පැවැත්වීම සඳහා මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභාව තීරණය කරන ලදී .**

**6: 2: 3** ‘ ක්‍රීඩා කටයුතු සඳහා භූමි ප්‍රදේශයක් ඉල්ලා සිටීම ’ මැයෙන් පින්නදූව ක්‍රීඩා සමාජයේ ලේකම් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

පින්නදූව කෙරම්ණිය බල ප්‍රදේශය තුළ ක්‍රීඩා හැකියාවන්ගෙන් සපිරි ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැසක් සිටින බවත් ඔවුන්ට ක්‍රීඩා කටයුතු වල නියැලීම සඳහා භූමි භාගයක් නොමැති බවත් ඒ සඳහා අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **මේ සඳහා භූමි භාගයක් සොයා ගත යුතු බවට සභාව තීරණය කරන ලදී .**

**6: 3** **2014- 03- 20** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව</u>**
**<u>2014.03.20 ප.ව. 2.30</u>**

**<u>සහභාගීත්වය</u>**

| | |
|---|---|
| ❖ *එච්.එල්. අනුර කිත්සිරි මහතා.* | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ *වෛද්‍ය ජී. ආර්.එන් ද සිල්වා මිය* | සෞ.වෛ.නිලධාරී අම්බලන්ගොඩ. |
| ❖ භාරත සමරසේකර මමතා. | ලේකම් අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ එම්.එච් නිහාල් රණසූරිය මහතා. | පරිපාලක ම. සෞ. පරීක්ෂක, සෞ.වෛ.නි. කාර්යාලය |
| ❖ පී. එස්. එස්. ද සිල්වා මහතා. | ම. සෞ. පරීක්ෂක, අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ ඩබ්.එන්.අයි මෙන්ඩිස් මහතා. | ම. සෞ. පරීක්ෂක, අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ ඩී.එස්.ඊ. ගමගේ | ප.සෞ.සේ. නිලධාරිනී. |
| ❖ පී. එච්. එල්. සී. පුෂ්පරාණි මහත්මිය. | සං සහකාර, අම්බලන්ගොඩ නගර සභාව, |
| ❖ ජී. කුසුම් ද සිල්වා මහත්මිය. | කළමණාකරණ සහකාර |
| ❖ ආර්.ඩී දිනූෂා මදුරංගනී.මිය | සංවර්ධන නිලධාරී ප්‍රා. ලේ. අම්බලන්ගොඩ |
| ❖ පී.එච්.එච් ප්‍රියංකර මහතා. | සංවර්ධන නිලධාරී ප්‍රා. ලේ. අම්බලන්ගොඩ |
| ❖ ඩබ්.එච් කේ ගම්භීර මහතා | සංවර්ධන නිලධාරී ප්‍රා. ලේ. අම්බලන්ගොඩ |
| ❖ පී.එස්.එන් විජේනායක මිය | කෘ..ප.නි.ස. ගො.සේ ම. අම්බලන්ගොඩ |
| ❖ එස්.එස්.පී ද සිල්වා මහතා. | කෘ..ප.නි.ස. ගො.සේ ම. අම්බලන්ගොඩ |
| ❖ එන්.ඊ.ඩී ආර් ප්‍රියදර්ශනී | සංවර්ධන නිලධාරී ප්‍රා. ලේ. අම්බලන්ගොඩ |
| ❖ ඒ..එල් චතුරිකා මිය | ප්‍රා. ලේ කාර්යාලය අම්බලන්ගොඩ. |
| ❖ කේ.එල් දිලූෂා ප්‍රියදර්ශනී මිය | සංවර්ධන නිලධාරී ප්‍රා. ලේ. අම්බලන්ගොඩ |
| ❖ ඩබ්.ඒ.තුෂානි නෙරංජලා. | සංවර්ධන නිලධාරී ප්‍රා. ලේ. අම්බලන්ගොඩ |
| ❖ ජී අයි. ඩී වික්‍රමසිංහ මහතා. | සංවර්ධන නිලධාරී ප්‍රා. ලේ. අම්බලන්ගොඩ |
| ❖ එච්.කේ.තරංගි නිලූශිකා මිය. | සංවර්ධන නිලධාරී ප්‍රා. ලේ. අම්බලන්ගොඩ |
| ❖ පී.එච්.කුමාර ද සිල්වා මහතා. | ග්‍රාම නිලධාරී කෙරමිණිය |
| ❖ කේ.පී.පී. නිලංගිකා මිය | සංවර්ධන නිලධාරී ප්‍රා. ලේ. අම්බලන්ගොඩ |
| ❖ එච්.එම්.ටී.එච් ද සිල්වා මහතා | ග්‍රාම නිලධාරී ඕකන්ද / තල්ගස්ගොඩ |
| ❖ එම්.ඩබ්.එච්.එස්.චිත්‍රාවංශ මහතා | සෞඛ්‍ය පරිපාලක |
| ❖ එම් එච් පද්මසේන මහතා. | සෞඛ්‍ය පරිපාලක |
| ❖ ටී. බන්දුසීල | සෞඛ්‍ය පරිපාලක |
| ❖ ඒ.ඒ.කේ. රණවික්‍රම මහතා. | සෞඛ්‍ය පරිපාලක |

**පිළිගැනීම.**
ගරු නගර සභා මන්ත්‍රී, එච්.එල්. අනුර කිත්සිරි මහතා.
වැ.බ. සභාපති කමල් වැල්ලගේ මහතා හදිසි රාජකාරී කටයුත්තක් සඳහා නගරයෙන් බැහැරව යන බැවින් තමාට කමිටුවේ කටයුතු මෙහෙයවන ලෙස දැන්වූ බව පවසන ලදි.

2014 02 20 දින පැවති රැස්වීමේ සාකච්ඡා වූ කරුණු සමාලෝචනය

| | මාතෘකාව | සාකච්ඡා වූ කරුණු | ප්‍රකාශය කවුරුන් විසින්ද යන වග | තීරණය |
|---|---|---|---|---|
| | සුනබයන් වන්නත් කිරීමේ වැඩසටහන | සුනබයින් 415ක් වන්නත් කළ බව | ම.සෞ.ප.පී.එස් .එස්.ද සිල්වා මහතා | |
| | සෞඛ්‍ය අංශයේ සුළු මුදල් අත්තිකාරම් ලබා ගැනීම පිළිබඳ ගැටළුව | ආවරණ අනුමැතියට යටත්ව ලබා දීමට සභාව තීරණය කර ඇති බව | ලේකම් මහතා. | |
| | බින්දු විජේසූරිය කලායතනය අසල කසල දැමීම. | එම කසල බඳුන ඉවත් කර ඇති බවත් නැවත කසල බඳුන තබන ලෙස නිර්නාමික ලිපියක් ලැබී ඇති බවත්, එම ස්ථානයේ කසල බඳුනක් තැබීම නිසා අනතුරුදායක තත්වයක් ඇතිවන බැවින් කසල බඳුනක් තැබීම සුදුසු නොවන බව. | ම.සෞ.ප.පී.එස් .ස්.ද සිල්වා මහතා | කසල බඳුන අවශ්‍ය පුද්ගලයින් නම් වශයෙන් ඉදිරිපත් වුයේ නම් යම් තීරණයකට එළඹිය හැකි බව |
| | පුස්තකාලයට යාබද ආපන ශාලාවෙන් පිටවන අපද්‍රව්‍ය සම්බන්ධ ගැටළුව | අපද්‍රව්‍ය උරා ගැනීමේ වල සකස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ඇණවුම් කර ඇති බවත් ලැබුණු වහාම එය සකස් කරන බවත් පවසන ලදි. | එම්. ඩබ්. සිසිර කුමාර මහතා. | |
| | රාජකාරී වේලාවෙන් අනතුරුව වෙනත් සේවාවන් සඳහා සේවකයන් යෙදවීමට ලැයිස්තුවක් සකස් කිරීම. | එය සකස් කර ඒ අනුව ක්‍රියාත්මක වන බව | ම.සෞ.ප. පී.එස්.එස්.ද සිල්වා මහතා. | |
| | වෙනත් කරුණු | | | |
| | කසල අවසන් බැහැරලන ස්ථානයට ප්‍රවේශ මාර්ගය පස් දමා සකස් කිරීම | මීට පෙර කමිටුවකදී ද මේ පිළිබඳව සාකච්ඡා කළ ද එය තවමත් ඉටු වී නොමැති බව | ම.සෞ.ප. පී.එස්.එස්.ද සිල්වා මහතා. | |
| | | මෙම මාර්ගය සකස් නොකළහොත් තව දුරටත් කසල ප්‍රවාහනය කිරීම සිදු කළ නොහැකි බව | සෞ.ප. හිරාන් සංජීව මහතා. | |
| | | මෙම ස්ථානයේ කසල තුනී කිරීම සඳහා නොබෝ දිනකට පෙර පස් දැමුවද එම පස් පරීක්ෂාකිරීමේ දී රතු පස් නොවන බවත්, පස් කියුබ් 36 දැමු බව පැවසුවද දක්නට ලැබුණේ පස් කියුබ් 28ක් පමණක් බවත්. එම පස් කියුබ් 28 ද නිවැරදි කියුබ් නොවන බවත් වැඩ අධිකාරී මහතා සමග ගොස් පරීක්ෂා කර තම නිරීක්ෂණ ඉදිරිපත් කළ බවත් පවසන ලදි. | ම.සෞ.ප. පී.එස්.එස්.ද සිල්වා මහතා. | |
| | | එදින තමා ද එම ස්ථානය පරීක්ෂා කළ බවත් ම.සෞ.ප. පවසන කරුණු සත්‍ය බව. | වැඩ අධිකාරී එම්.ඩබ්. සිසර කුමාර මහතා. | මේ සම්බන්ධයෙන් මාසික සභාවේදී සාකච්ඡා කිරීමට කමිටුව තීරණය කරන ලදි. |
| | | පස් කියුබ් 36ක් දමන තුරු නොසිට මුල් | සංවර්ධන | |

| | | | | |
|---|---|---|---|---|
| | | කාලයේම පරීක්ෂා කළේ නම් මෙම ගැටළුව විසඳා ගැනීමට හැකි වන බව. | නිලධාරී පී අයි. ඩී වික්‍රමසිංහ මහතා. | |
| | | ඒ වන විට තමා වෙනත් රාජකාරියක නිරතව සිටි බව, | ම.සෞ.ප. පී.එස්.එස්.ද සිල්වා මහතා. | |
| | | මෙම ස්ථානයේ කසල බැහැර කිරීම නිසා විශාල පරිසර හානියක් සිදුවන බව පෙන්වා දෙමින් ඊට විසඳුමක් වශයෙන් වරාය භූමිය ආශ්‍රිතව මත්ස්‍ය අපද්‍රව්‍ය යොදා ගෙන ජීව වායුව නිපදවීම හා එම වායුව වරායටම ලබා දිය හැකි බවත්, පෙන්වා දෙන ලදි. | කෘ.ප.නි.ස. එස්.එස්. පී ද සිල්වා මහතා. | මේ සම්බන්ධයෙන් සභාවේදී සාකච්ඡා කිරීමට තීරණය කරන ලදි. |
| | THW නිවාස යොජනා ක්‍රමයේ වැසිකිළිවල හිස් කිරීම. | නිවාස 12ක පමණ වැසිකිළි එකම වලකට සම්බන්ධ කර ඇති අතර, එම වල හිස් කිරීමට ලෝඩ් 05ක් පමණ ඇදිය යුතු බවත්, ඒ සඳහා රු 30.000ක් පමණ වැය වන බවත්, එම මුදල දැරීමට ඒ අය අකමැති බවත්, පවසන ලදි. | ම.සෞ.ප. පී.එස්.එස්.ද සිල්වා මහතා. | මේ සම්බන්ධයෙන් සභාවේදී සාකච්ඡා කිරීමට තීරණය කරන ලදි. |
| | ජාතික මදුරු මර්දන සතිය | 2014 අප්‍රේල් මස 02 සිට 08 දක්වා ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන ඇතුළත් සෞඛ්‍ය අමාත්‍යංශය මගින් යොමු කර ඇති ලිපිය කමිටුවට ඉදිරිපත් කරන ලදි. | සෞ.වෛ.නිලධ ාරී වෛද්‍ය පී. ආර් .එන් ද සිල්වා මිය | වැඩසටහන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදි. |
| | 25 දින ධූමායන කටයුතු සිදු කිරීම | 25 දින ධූමායන කටයුතු සඳහා අවශ්‍ය වාහන ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි. | ම.සෞ.ප. පී.එස්.එස්.ද සිල්වා මහතා. | නගර සභාව් හා සෞ.වෛ.නි. කර්යාලයේ වාහන නොමැති අවස්ථාවකදී කුලියට වාහනයක් ලබා ගැනීමට සභා අනුමැතිය ලබා දී ඇති බැවින් ඒ අනුව කටයුතු කරීමට තීරණය කරන ලදි. |
| | කාර්‍ය මණ්ඩල සඳහා සෞඛ්‍ය සායනයක් පැවැත්වීම | ප්‍රා.ලේ . කර්යාලය හා නගර සභාව මගින් සායනයක් ලබා දෙන ලෙස ඉල්ලීම් ලිපි දිස්ත්‍රික් වෛද්‍ය නිලධරී වෙත යොමු කරන ලෙස පවසන ලදි. | සෞ.වෛ.නි වෛ. පී. ආර් .එන් ද සිල්වා මිය | |
| | | සායන පැවැතවීම සඳහා අනුග්‍රහය ලබා දෙන ලෙස සිංහ සමාජයෙන් ඉල්ලීමක් කරන ලෙස පවසන ලදි. | ගරු නගර සභා මන්ත්‍රී, එච්. එල්. අනුර කිත්සිරි මහතා. | |
| | වයට් හවුස් ආයතනය පිළිබඳ ගැටළුව | මෙම ස්ථානය මෙන්ඩිස් මහතා සමග ගොස් පරීක්ෂා කළ බවත් තාප අවශෝෂක උදුන සවි කිරීම හොඳින් සිදුකර ඇති බවත්, එහි ශබ්දය මැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය ලවා ශබ්ද මට්ටම් පරීක්ෂාව සිදු කර ගන්නා ලෙස දන්වා යැවීම සුදුසු බව පවසන ලදි. | ම.සෞ.ප. පී.එස්.එස්.ද සිල්වා මහතා. | වයිට් හවුස් ආයතනයට මධ්‍යම පරිසර අධිකාරිය ලවා ශබ්ද මට්ටම් පරීක්ෂාව සිදු කර ගන්නා ලෙස, දන්වා යැවීමට තීරණය කරන ලදි. |
| | ස්තුති කතාව | අද දින රැස්වීම සඳහා පැමිණි සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ට ස්තුතිය පුද කරන බව ප්‍රකාශ කරන ලදී. | නගර සභාවේ ලේකම් භාරත සමරසේකර | |

| | | | මහතා. | |
|---|---|---|---|---|
| | නිමාව ප.ව.04.30 | | | |

සකස් කළේ :
පී.එච්.එල්.සී.පුෂ්පරාණි.
සංවර්ධන සහකාර (සැලසුම්)

**ඒ අනුව 2014 -03- 20 දින පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්‍ෂක කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

## (07) ටෙන්ඩර් හා මිල ගණන්

**7:1** **ටෙන්ඩර් හා මිළගණන්** :-

**7:1:1** ටෙන්ඩර් :- නැත

**7:2** **මිල ගණන්** :-

**7:2:1** Pre Ink Seal සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඩයමන්ඩ් ඇඩ්වටයිසින් | ඩයස් ප්‍රින්ටර්ස් | රීටා ප්‍රින්ට් හවුස් |
|---|---|---|---|---|---|
| 01 | Pre ink seal 34X34mm | | **700/-** | 725/- | 730/- |
| 02 | Pre ink seal 45X20mm | | **680/-** | 700/- | 710/- |
| 03 | Pre ink seal 66X23mm | | **780/-** | 800/- | 825/- |
| 04 | Pre ink seal 66X25mm | | **-** | 850/- | 875/- |
| 05 | Pre ink seal 79X25mm | | **900/-** | 925/- | 950/- |
| 06 | Pre ink seal 66X31mm | | **980/-** | 1030/- | 1000/- |
| 07 | Pre ink seal 26X9mm | | **275/-** | 300/- | 310/- |
| 08 | Pre ink seal 34X13mm | | **525/-** | 560/- | 575/- |
| 09 | Pre ink seal 66X12mm | | **-** | - | - |
| 10 | Pre ink seal 66X23mm | | **780/-** | 800/- | 825/- |
| | | | | | |

**7:2:2** පුටු වැල් විවීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනිමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | පී. වයි. පියදාස මයා | ඒ. පී. මනෝර මයා | |
|---|---|---|---|---|---|
| 01 | පුටු වැල් වියා සැකසීම | | 300/- | 450/- | |
| | ඇඳ සහිත පුටු (ලොකු) | | 250/- | 400/- | |
| | ඇඳි රහිත පුටු (කුඩා) ස්ටූල් | | - | 450/- | |
| | | | | | |

**7:2:3** වේවැල් කුඩ සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනිමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ආර්. එම්. රවින්ද්‍ර | නයන රංජන සේල් පොල | රාජපක්‍ෂ ස්ටෝර්ස් |
|---|---|---|---|---|---|
| 01 | වේවැල් කුඩ | | 250/- | 275/- | 260/- |
| | | | | | |

**7:2:4** හාඩිමෙක් යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනිමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | විජේසූරිය මෝටර්ස් | අමන්දා මෝටර්ස් | නිව් භවානා මෝටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | SA- 2806 දරණ හාඩිමෙක් යන්ත්‍රයේ Overflow හයිඩ්‍රොලික් බටය ½” | | 150/- | 220/- | 190/- |
| | | | | | |

**7:2:5 CFL** බල්බ සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනිමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | **Rainbow Book Shop** | **Polycrome Electrical** | **Chanaka Enterprise** |
|---|---|---|---|---|---|
| 01 | CFL බල්බ් 18W | | 400/- | 399/84 | 394/24 |
| | 23 W | | 425/- | 421/12 | 416/64 |
| | | | Osram | Polycrome | Polycrome |

**7:2:6** විදුලි පන්දම් සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ජෙනරල් ස්ටෝර්ස් | රාජපක්ෂ ස්ටෝර්ස් | ආර්. එම්. රවින්ද්‍ර |
|---|---|---|---|---|---|
| 01 | විදුලි පන්දම් (චාර්ජ් කල හැකි) | | - | 280/- | 340/- |
| | | | | 375/- | 425/- |

**7:2:7** පාපැදි සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | හේමසිරි වීරරත්න | සුමිත් සයිකල් | රාජපක්ෂ සයිකල් |
|---|---|---|---|---|---|
| 01 | පාපැදි | | 13500/- | 13700/- | 12900/- |
| | පාපැදි ටයර් | | - | 1000/- | 700/- |
| | පාපැදි ටියුබ් | | - | 450/- | 260/- |

## (08) ගෙවීම්

8. 1 ඇ. අංක 0981,982 යටතේ කාර්යාලයට ලබාගන්නා ලද ලිපිද්‍රව්‍ය සඳහා මහා වීදිය, අම්බලන්ගොඩ, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි, රු. 54525/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| A4 පැකට් සුදු | 575/- X 60 | - | 34500/- |
| A4 පාට | 500/- X 10 | - | 5000/- |
| ෂ්ටෙප්ලර් කටු | 22/- X 50 | - | 1100/- |
| ෆයිල් කටු | 20/- X 50 | - | 1000/- |
| බොක්ස් ෆයිල් | 200/- X 10 | - | 2000/- |
| ලිගල් කොල පැකට් | 775/- X 1 | - | 775/- |
| කතුරු | 90/- X 10 | - | 900/- |
| යතුරු ලියන කඩදාසි | 370/- X 25 | - | 9250/- |
| | | | 54525/- |

8.2 ඇ. අංක 0997 යටතේ කාර්යාලයට ලබා ගත් ලිපිද්‍රව්‍ය සඳහා අම්බලන්ගොඩ, කුලරත්න පාර, සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 27150/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| න. ස. 3 පොත් | 219/- X 100 | - | 21900.00 |
| පෝස්ටර් | 17/50 X 300 | - | 5250.00 |
| | | | 27150.00 |

8.3 ඇ. අංක 984,985 යටතේ කාර්යාලයට ලබා ගත් ලිපිද්‍රව්‍ය සඳහා අම්බලන්ගොඩ, කුලරත්න පාර, සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 74750/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| ලිපි බෙදාහැරීමේ ලේඛන | 562/50 X 20 | - | 11250.00 |
| ඉන්ධන ඇනවුම් පොත් | 10/- X 275 | - | 2750.00 |
| GRN පරිගණක කඩදාසි | 12/50 X 2500 | - | 31250.00 |
| න. ස. 3 පරිගණක කඩදාසි | 11/80 X 2500 | - | 29500.00 |
| | | | 74750.00 |

8.4 ඇ. අංක 0983 යටතේ කාර්යාලයට ලබා ගත් ලිපිද්‍රව්‍ය සඳහා අම්බලන්ගොඩ, කුලරත්න පාර, සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 15580/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| ලිපි ශීර්ෂ සාමාන්‍ය | 195/- X 15 | - | 2925.00 |
| ලිපි ශීර්ෂ විශේෂ | 494/- X 15 | - | 7410.000 |
| 9X4 ලියුම් කවර | 1/65 X 2000 | - | 3300.00 |
| ලිපිගොනු කවර | 9/75 X 200 | - | 1950.00 |
| | | | 15585.00 |

8.5 ඇ. අංක 0324 යටතේ නගර සභාවට අයත් අබලන් වූ කුෂන් පුටු නැවත සැකසීම වෙනුවෙන් අම්බලන්ගොඩ, මහාවිදිය ඩබ්. ලිටින් මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 20000/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| කුෂන් පුටු | 20 X 1000/- | - | 20000/- |

8.6 ඇ. අංක 0987 යටතේ ජායා පිටපත් යන්ත්‍රයේ ඩ්‍රම් යුනිට් එක දැමීම වෙනුවෙන් මාතර, අනගාරික ධර්මපාල මාවත, මෙට්‍රොපොලිටන් ඔෆිස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 28980/50 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.7 ඇ. අංක 0960 යටතේ ලබා ගන්නා ලද විදුලි උපකරණ සඳහා ගාලු පාර, බලපිටිය උයද පුෂ්ප එන්ටර්ප්‍රයිසස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57946/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Main Switch | 2X 1510/- | - | 3020/- |
| Trip Switch | 2X 4018/- | - | 8036/- |
| 10 A Bakers | 10X 614/- | - | 6140/- |
| 3 gang Switch | 2X 335/- | - | 670/- |
| Tube light sets | 13X 998/- | - | 12974/- |
| Ceiling Fan | 4X 3200/- | - | 12800/- |
| CG Holders | 50X 75/- | - | 3750/- |
| Baker Box | 1X 590/- | - | 590/- |
| Bus Bar | 15X 12/- | - | 180/- |
| Angle Holder | 8X 103/- | - | 824/- |
| Ceiling Rose | 8X 45/- | - | 360/- |
| 1/044 Wire Roll | 5X 1720/40 | - | 8602/- |
| | | | 57946/- |

8.8 ඇ. අංක 0959 යටතේ ලබා ගන්නා ලද විදුලි උපකරණ සඳහා ගාලු පාර, බලපිටිය උයද පුෂ්ප එන්ටර්ප්‍රයිසස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 46025/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| 32 Amp Iron glass switch | 10X 2390/- | - | 23900/- |
| 1 gang switch | 25X 135/- | - | 3375/- |
| Holders | 75X 250/- | - | 18750/- |
| | | | 46025/- |

8.9 ඇ. අංක 0976 යටතේ ලබා ගන්නා ලද ලිපිද්‍රව්‍ය සඳහා අම්බලන්ගොඩ, කුලරත්න පාර, සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 102200/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Certificate | 340 X 42/50 | - | 14450/- |
| Certificate | 180 X 45/- | - | 8100/- |
| File Cover | 600 X 55/- | - | 33000/- |
| Sounier | 600 X 47/50 | - | 28500/- |
| Invitatation Card | 250 X 21/- | - | 5250/- |
| Posters | 300 X 43/- | - | 10900/- |
| | | | 102200/- |

8.10 ඇ. අංක 0798 යටතේ ලබා ගන්නා ලද භාණ්ඩ සඳහා අම්බලන්ගොඩ, මහා වීදියේ ඉදුනිල් හාඩ්වෙයාර් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 15950/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Emultion 04 L | 2 X 2825/- | - | 5650/- |
| Emultion 01 L | 2 X 785/- | - | 1570/- |
| Enamel 01 L | 2 X 930/- | - | 1860/- |
| Enamel 04 L | 2 X 3435/- | - | 6870/- |
| | | | 15950/- |

8.11 ඇ. අංක 0994 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද GAS වෙනුවෙන් අම්බලන්ගොඩ, මහ අම්බලන්ගොඩ , එම්. පී ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57920/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| 37.5 kg Gas Cylinder | 8 X 7240/- | - | 57920/- |

8.12 හල්වතුර කසල බැහැරලන ස්ථානයට ලබා ගත් පස් සඳහා අම්බලන්ගොඩ, එපිටමුල්ල පාර පී. එච්. සී. සී. ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 37800/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| පස් කියුබ් | 28 X 1350/- | - | 37800/- |

8.13 මාර්ග නඩත්තුවට අවශ්‍ය තාර මිලදී ගැනීම සඳහා මුතුරාජවෙල ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 231840/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| තාර බැරල් | 14 X 16560 | - | 231840/- |

8.14 මාර්ග නඩත්තුව සඳහා අවශ්‍ය කෝලාස් බැරල් 05 ක් මිලදී ගැනීම වෙනුවෙන් කොළඹ 02, යුනියන් පෙදෙස ලංකෙම් සිලෝන් PLC වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 103600/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| කෝලාස් බැරල් | 5 X 18560 | - | 92500/- |
| VAT | | | 11100/- |
| | | | 103600/- |

8.15 නගර සභාව සතු 53-0529 අංක දරණ කැබ් රථය සඳහා 2014 පෙබරවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 11262.30 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4538 | ඩීසල් | 46 |
| 4554 | ඩීසල් | 47 |

8. 16 නගර සභාව සතු 49 - 9422 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2014 පෙබරවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 11487.70 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4543 | ඩීසල් | 37 |
| | එන්ජින් ඔයිල් | 03 |
| 4559 | ඩීසල් | 30 |
| | එන්ජින් ඔයිල් | 05 |

8.17 නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි බවුසර රථය සඳහා 2014 පෙබරවාරි මස 15-28 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 17421.80 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4576 | ඩීසල් | 138 |
| | එන්ජින් ඔයිල් | 02 |

8.18 නගර සභාව සතු LF-1853 අංක දරණ ටිපර් රථය සඳහා 2014 පෙබරවාරි මස 15-28 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 16348.50 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4564 | ඩීසල් | 70 |
| 4579 | ඩීසල් | 65 |

8:19 2013 දෙසැම්බර් මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11453 I | 51876.77 |
| 23453 I | 1541.38 |
| 34453 I | 3490.88 |
| 52453 I | 53974.01 |
| 53454 | 16923.00 |
| 62453 I | 28021.03 |
| | 155827.07 |

විදුලි බිල්පත් සඳහා රු. **155827.07** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:20 2013 දෙසැම්බර් මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 52453 II | 31823.30 |
| 62453 II | 17082.62 |
| 34453 II | 1018.08 |
| 23453 II | 13097.86 |
| 11453 II | 8986.88 |
| | **72008.74** |

ජල බිල්පත් සඳහා රු: **72008.74** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:21 2014 ජනවාරි මාසයට අදාල දුරකතන බිල්පත සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවීම.

| වැය අංකය | සැප්තැම්බර් |
|---|---|
| 11452 | 29666.25 |
| 12452 | 1163.28 |
| 25451 II | 2518.80 |
| 62452 I | 5019.11 |
| | **37232.09** |

දුරකතන බිල්පත සඳහා රු **37232.09** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:22 .re iNdm;s;=ud" Wm iNdm;s;=ud we;=,q k.r iNd uka;%Sjrekaf.a 2013 fkdjeïn¾" foieïn¾ iy 2014 ckjdrs udi i|yd .uka úhoï oSukdj fjkqfjkaa re' 60000.00 l uqo,la f,alïf.a ks¾foaYh mßos f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

8:23 k.r iNdj u.ska md,kh jk mqia;ld, i|yd 2014 fmnrjdrs udihg imhk ,o mqj;am;a fjkafjka re' 35580.00 l uqo,la f,alïf.a ks¾foaYh mßos tï' tia' ùrisxy uy;d fj; f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

8:24 2014 ckjdrs ui VAT uqo,a wdmiq f.ùu fjkqfjka re' 50000.00 l uqo,la f,alïf.a ks¾foaYh mßos foaYsh wdodhï flduidßia ckrd,a fj; f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

8:25 m<d;a md,k kS;sh ms<sn| iy;sl m;% mdGud,dj yeoEÍu i|yd .re k.r iNd uka;%S tÉ' t,a' wkqr ls;aisß uy;d fjkqfjka re' 15000.00 l uqo,la f,alïf.a ks¾foaYh mßos m<d;a md,kh ms<sn| Y%S ,xld wdh;kh fj; f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

8.26 ක්‍රීඩා පිටියේ පස් කඩා ඉවත් කිරීම හා පොල්වත්ත සුසාන භූමියේ වලක් කැපීම වෙනුවෙන් JCB යන්ත්‍රය භාවිතය සඳහා අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ දීපිකා කන්ස්ට්‍රක්ෂන් හි ජේ. ඩබ්. තුෂාරි දීපිකා මිය වෙත රු. 14280.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| මීටර් පැය | 6.8 X 2100/- | - | 14280/- |

8:27) හිගල්දුව පාර පැතිබැම්ම ඉදිකිරීම 10% ක රැඳවුම් මුදල ගෙවීම වෙනුවෙන් තිලකපුර බෙංවල එක්සත් ගොවි සංවිධාන සමිතිය වෙත රු. 10524.64 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:28) ගා/ පී. ද ඇස් කුලරත්න විද්‍යාලයට පිවිසෙන රණසූරිය පාර අවසාන කොටස හා කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම 10% ක රැඳවුම් මුදල ගෙවීම වෙනුවෙන් වෙරළ පාර 01 ග්‍රාමීය සමෘද්ධි සංවර්ධන සමිතිය වෙත රු. 95941.66 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:29) කෙරම්ණිය කුකුලු ගොව්පල පාර සංවර්ධනය කිරීම රැඳවුම් මුදල ගෙවීම වෙනුවෙන් බටපොල බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත රු. 44567.95 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:30) පින්නදුව III වන හරස් පාර කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීම 10% ක රැඳවුම් මුදල ගෙවීම වෙනුවෙන් බටපොල බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත රු. 50000.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:31) 252-0730 කැබ් රථයේ හා LF - 1853 ටිපර් රථයේ ආදායම් බලපත්‍ර ලබා ගැනීමට ගනු ලැබූ රු. 18260.00 ක අත්තිකාරම් මුදලේ බිල්පත් පියවීම සඳහා ලේකම්ගේ නිර්දේශය පරිදි සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:32) GL- 9369 ගලි බවුසරයේ රක්ෂණ වාරිකය ලෙස රු. 84436.15 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ශ්‍රී ලංකා ඉන්ෂ්වරන්ස් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:33) මහ අම්බලන්ගොඩ නිවාස යෝජනා ක්‍රමයේ කාණු පද්ධතිය ඉදිකිරීම කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල ගෙවීම වෙනුවෙන් ඕකන්ද ග්‍රාමීය සමෘද්ධි සංවර්ධන සමිතිය වෙත රු. 80233.40 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:34) පින්නදුව පොදු නාන ළිඳ අලුත්වැඩියා කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම වෙනුවෙන් කෙරම්ණිය කුඩා ගම්මාන සමිතිය වෙත රු. 57880.31 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:35) හිරේවත්ත පුස්තකාලය අසලින් ඇති උස්වැල්ල පාරේ සිට මහා විදිය දක්වා ඇති පාර කොන්ක්‍රීට් ගල් අතුරා සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් ගෙවීම වෙනුවෙන් වෙරළ පාර 01 ග්‍රාමීය සමෘද්ධි සංවර්ධන සමිතිය වෙත රු. 38589.32 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:36) හිරිකැටිය පටුමග 1 කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් ගෙවීම වෙනුවෙන් ආර්. ඊ. ද සිල්වා මාවත කුඩා ගම්මාන සමිතිය වෙත රු. 50968.51 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:37) හිරිකැටිය පටුමග 1 මාර්ගය සංවර්ධනය කිරීම අතිරේක වැඩ 1 අදියර කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් ගෙවීම වෙනුවෙන් ආර්. ඊ. ද සිල්වා මාවත කුඩා ගම්මාන සමිතිය වෙත රු. 18645.67 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:38) හිරිකැටිය පටුමග 1 මාර්ගය සංවර්ධනය කිරීම අතිරේක වැඩ 11 අදියර කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් ගෙවීම වෙනුවෙන් ආර්. ඊ. ද සිල්වා මාවත කුඩා ගම්මාන සමිතිය වෙත රු. 1544.31 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

## (09) ගිණුම්

**9:1** 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වාර්තාව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## (10) ඇස්තමේන්තු

10:1) නිව්යෝර්ක් ගම්මානයේ කාණු පිළිසකර කිරීමේ කර්මාන්තය සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 220537.90 ක් වූ ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීම.

<u>තීරණය</u>

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:2) තල්ගස්ගොඩ පටුමග හරස් පාර කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 102085.78 ක් වූ ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීම.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10:3** අම්බලන්ගොඩ බෞද්ධ කලා පුරවරයේ පැවැත්වෙන වෙසක් කලාපය වෙනුවෙන් ප්‍රජා සංවර්ධන නිලධාරී මහත්මිය විසින් සකස් කරන ලද රු. 60000.00 ක් වූ (වේදිකාව සඳහා රු. 30000.00, ශබ්ද විකාශන සඳහා රු. 20000.00, වේදිකාවේ විදුලි ආලෝකය සඳහා රු. 10000.00,) ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## (11) වෙනත් කරුණු

**11:1** ' 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 1, ' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

2014 පෙබරවාරි මාසයේ වැඩසටහන 1 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

තීරණය

☞ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**11:2** ' 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 2, ' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

2014 පෙබරවාරි මාසයේ වැඩසටහන 2 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

තීරණය

☞ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**11:3** ' 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 3, ' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

2014 පෙබරවාරි මාසයේ වැඩසටහන 3 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

තීරණය

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**11:4** ‘ 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 5 ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

2014 පෙබරවාරි මාසයේ වැඩසටහන 6 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**11:5** ‘ 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 6 ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

2014 පෙබරවාරි මාසයේ වැඩසටහන 6 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**11:6** ‘ 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වෙනත් ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

2014 පෙබරවාරි මාසයේ පොදු ගිණුමට අදාල වෙනත් විෂයන්ගේ වැය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**11:7** ‘ 2014 - මාසික සභාවට ඉදිරිපත් කිරීම විවිධ ගිණුම් ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

2014 ජනවාරි, පෙබරවාරි මාස සඳහා සේවක ණය, සේවක ප්‍රතිලාභ, ප්‍රජා, ක්‍රීඩා, නගර අලංකරණ හා ප්‍රාග්ධන ගිණුම් යටතේ දරණ ලද වියදම් ඉදිරිපත් කර තිබුණි.

තීරණය

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12:1** ‘ අංක SD/2014/37 දරණ ’ වර්ණකුල පටබැඳිගේ ලලිතා කාන්ති නන්දසිරි මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද අනුබෙදුම සභාගත කරන ලදී.

SD/2014/37 දරණ ඉඩම් අනුබෙදුම වර්ණකුල පටබැඳිගේ ලලිතා කාන්ති නන්දසිරි යන අය විසින් කොටස් තුනකට බෙදා A කොටස පොරව ගමගේ සුමුදු කාංචනා නන්දසිරි යන තම දුවටද B කොටස පොරව ගමගේ සුරෙනි කුමුදු නන්දසිරි යන තම දුවටද C කොටස වර්ණකුල පටබැඳිගේ ලලිතා කාන්ති නන්දසිරි යන අයටද පවරන බවත් විකිණීමක් සිදු නොවන බවත් එම නිසා 1% ගාස්තු නිදහස් කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☛ **නිවැරදිව ඉදිරිපත් කරන ලද දිව්රුම් ප්‍රකාශයක් ලබා ගෙන A, B, C කොටස් තුන සඳහා 1% ගාස්තු නිදහස් කිරීමටත් මෙම නම් වලින් නොවන වෙනත් නමකට හැරවීමේදී අදාල 1% ගාස්තු අය කිරීමට වරිපනම් ලේඛනයේ සඳහන් කර තැබීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:2** ‘ බැනරයක් නොමිලයේ ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා ගැනීම ’ මැයෙන් අම්බලන්ගොඩ රුහුණු රන්සලු අලෙවි ස්ථානයේ ස්ථානභාර නිලධාරී විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

දකුණු පළාත් කර්මාන්ත අධ්‍යක්ෂ කාර්යාලය යටතේ පවත්වාගෙන යන රුහුණු රන්සලු අලෙවි සැල සම්බන්ධ බැනරයක් බස් නැවතුම්පොල ඉදිරිපිට ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

තීරණය

☛ **රුහුණු රන්සලු අලෙවි සැල සම්බන්ධ බැනරයක් බස් නැවතුම්පොල ඉදිරිපිට ප්‍රදර්ශනය කිරීම සඳහා සහ අනුමැතියට යටත්ව අවසර ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:3** ‘ අම්බලන්ගොඩ නගරයේ ඇති තට්ටු ගොඩනැගිලි වල හා අනෙකුත් ප්‍රදේශ වල ගිනි වැළැක්වීමේ ගිනි නිවන සැලැස්මක් සම්බන්ධවයි ’ මැයෙන් මීටියාගොඩ අංක 443/3 හි ටී. එච්. ගාමිණී සිල්වා මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඉහත ලිපිනයේ පදිංචි තමා ශ්‍රී ලංකා ගුවන් හමුදා ගිනි නිවීම් සේවයේ වසර 22 ක් සේවය කර විශ්‍රාම ගිය පුද්ගලයකු බවත් අම්බලන්ගොඩ නගරය ජනාකීර්ණ නගරයක් සහ තට්ටු ගොඩනැගිලි වලින් සමන්විත නගරයක් වන බැවිනුත් ගිනි නිවීමේ පරීක්ෂණයක් කල බවත් එයට අදාල නිරීක්ෂණ හා යෝජනා ලෙස අදාල ස්ථානයන්ට පහසුවෙන් ලගා වීමට නොහැකි වීම, තට්ටු ගොඩනැගිලිවල ස්ථිර ගිනි නිවන ආරක්ෂක පද්ධති නොමැතිවීම, සමහර ගොඩනැගිලිවල ප්‍රථමාධාර ගිනි නිවන උපකරණයක්වත් නොමැතිවීම, ඒවායේ සේවය කරන සේවකයන් එම උපකරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධව

දැනුමක් නොමැති අය වීම, ගොඩනැගිලිවල ද්‍රව්‍ය ගබඩා කිරීමේදී නිසි ප්‍රමිතියකට නොතිබීම, ගොඩනැගිලිවල පරතරය අඩු බැවින් ගිනි පැතිරීයාම ඉක්මන් වීම, සමහර ගොඩනැගිලිවල විදුලි රැහැන් අනාරක්ෂිතව පැවතීම, සමහර ගොඩනැගිලිවල ඇතුල්වීමේ හා පිටවීමේ දොරටු නිසි ආකාරයෙන් නොපැවතීම, වෙනත් නගරයක සිට ගිනි නිවීම් රථ ලගා වීමට වැඩි කාලයක් ගතවීම, නගරය තුල හදිසි අවස්ථාවකදී ක්‍රියාත්මක වීමට ගිනි නිවන රථයක් හෝ කණ්ඩායමක් නොමැතිවීම වැනි කරුණු පවතින බවත් මේ සම්බන්ධව නිසි කටයුතු සඳහා යොමු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා නගරයේ වුන ගිනි ගැනීම් වුනේ දවල් කාලයේදී. රාත්‍රී කාලයේදී වුනානම් තත්වය මීට වඩා හුගක් බරපතල වෙනවා. සමහර තැන්වල අපි දැකල තියෙනවා වයර් නිකම්ම එල්ලිලා තියෙන්නෙ. බටයක් ඇතුලෙන්වත් ගිහිල්ල නැහැ. සමහර ඒවා විදුලි කාන්දුව නිසා වුන ගිනිගැනීම්. ඒවගේම සමහර කඩවල පිටවීමට දොරක් නැහැ. මේවගේ කාරණා බොහෝ තියෙනවා. පී. එම්. එස්. මහත්මයා සභාපති ඉන්න කාලෙ අපි හදිසි අවස්ථාවක වතුර ගන්න ස්ථාන තුනක් දාල තිබුනෙ. ලාල් මහත්මය ඒකට ගොඩක් උදව් කරා. ඒකට පොඩි ප්‍රශ්නයක් වුනේ හෝස් පයිප්පයක් ගන්න එක. ටවර් එකේ මහත්මය අරගෙන දෙන්න කැමති වුනා. නමුත් ඒ මහත්මය දැන් නැහැ.  අපේ අදහස තිබුනෙ හදිසියක් වුන වෙලාවට ඒ හොස් එක ගහල වතුර අරගෙන කටයුතු කරන්න. මම හිතනව ඒක වැදගත් කටයුත්තක්. මේ දේ ක්‍රියාත්මක කරොත් අපිට ලොකු ප්‍රයෝජනයක් තියෙනවා. මම ව්‍යාපාරිකයෙක් නෙමෙයි. නමුත් ව්‍යාපාරිකයින් මේකට උනන්දු වුනොත් ඒක ලො දෙයක් වෙනවා. වෙළඳ සංගමෙත් මේකට උනන්දු  වෙන්න ඕනෙ. බැලුවම කඩ කීයක් කඩලද? මේ දේවල් වලට වෙළඳ සංගමෙත් මැදිහත් වෙන්න ඕනෙ.  ඕක පටන් ගත්ත දවස්වල හතර දෙනෙක් අරගෙන ඒඅ ය රාත්‍රී කාලයේ යම් කිසි සෙවිල්ලක් කරා. දැන් එහෙම දෙයක් නැහැ. පොලිසියෙන් කියලත් කෙරෙන්නෙ නැහැ. අජිත් සිල්වා මහත්මයගෙ කඬේ තුන් සැරේකට කැඩුවා. ඒ කඬේ තියෙන්නෙ හැමෝටම පේන තැනක. ඒ නිසා වෙළඳ සංගමයත් එක්ක සාකච්ඡා කරන වෙලාකව ගිනි නිවීම සම්බන්ධව සහ ආරක්ෂාව සම්බන්ධව ඔවුන් දැනුවත් කරන්න. මේ ලිපිය එවපු ඒ මත්මයත් මේ කමිටුවට කැඳවල ලාල් මහත්මයත් කැඳවල සාකච්ජා කරල තීරණයක් ගන්න කියල ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ඇත්තටම අපි අම්බලන්ගොඩ නගරය විදියට මෙය අත්‍යවශ්‍ය දෙයක්. මීට වසර දහයකට විතර පෙර ජලනල එලද්දි මේ සඳහා විශේෂ ක්‍රමවේදයක් ආරම්භ කරා. අගල් දෙකක නලයක් වෙනමම ස්ථාපිත කරා ජයන්ත මන්ත්‍රීතුමා කියපු ආකාරයට. නගරයේ තුන් තැනක. මේකට ලැබිච්ච වැල් ටික හිටපු සභාපතිතුමාලගේ ගෙදර වෙන්න ඕනෙ. ඒ කාලෙ මට මතකයි එතුමා කිව්ව. ඒව සුරක්ෂිතව ඇති. මොකක්හරි ආධාර දෙන ආයතනයකින් දුන්නෙ. පොඩ්ඩක් හොයල බලන්න. මෙතුමා කිව්ව වගේ මේ ලිපිය එවපු මහත්මය කැඳවල සාකච්ජාවක් තියල අපේ මට්ටමින් ක්ෂණිකව ක්‍රියාත්මක කරන්න පුලුවන් දෙයක් කරන්න පියවර ගන්න කියල ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි සභාවට අයිති දෙයක් ගෙදර තියාගන්න පුලුවන්ද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාවට අයිති දෙයක් නෙමෙයි ඒක පරිත්‍යාගයක්. ආරක්ෂාවට එහෙ තියනවයි කියල කිව්වෙ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේ සභාවට පරිත්‍යාග කරපු දෙයක් ගෙදර තිබ්ල හරියන්නෙ නැහැනෙ. ඒ නිසා සභාපතිතුමා කරුණාකරල මේ ගැන සොයා බලන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මම ප්‍රකාශ කරේ අනිවාර්යෙන්ම තිබුනයි කියල නෙමෙයි එතුමාට ලැබුනයි කියල මම විශ්වාස කරනවයි කියලා. ඒක තිබෙනව නම් එතුමගෙන් ඉල්ල ගන්න පුලුවන්.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි මම කියන්නෙ මේ සභාවට මොන විදියෙන් ලැබුනත් ඒක සභාව සතු දෙයක්. අපි මෙතෙක් කල් දන්නෙ නැහැ මේක.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාව දන්නෙත් නැහැ ඒක. වෙළඳ ව්‍යාපාරිකයො අල්ලගෙන කරපු දෙයක් ඒක.

**තීරණය**

☞ **මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව වෙළඳ සංගමයේ කමිටු රැස්වීම සඳහා ටී. එච්. ගාමිණී සිල්වා මහතා, අම්බලන්ගොඩ ජල සම්පාදන මණ්ඩලයේ හිටපු ස්ථාන භාර නිලධාරී ලාල් මහතා සහ දැනට ස්ථාන භාර නිලධාරී මහතා ද කැඳවා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණයක් ගැනීමට සභාව තීරණය කරන ලදී.**

**12:4** **‘** ශ්‍රී විජයාරාම විහාරස්ථානයට ගමන්මග දැක්වීම සඳහා නාම පුවරුවක් සවි කිරීමට අවසර ලබා ගැනීම **’** මැයෙන් ශ්‍රී විජයාරාම දායක සභාවේ ගරු ලේකම් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

කලුවඩුමුල්ල ශ්‍රී විජයාරාම විහාරස්ථානය එහි ඇති සුවිශේෂ කලා නිර්මාණයන් නිසා සුප්‍රසිද්ධියට පත්ව ඇති බවත් නන් දෙසින් බැතිමතුන් මෙම විහාරස්ථානය කරා පැමිණෙන බවත් ඔවුන්ගේ පහසුව සඳහා විහාරස්ථානය දක්වා වූ ගමන් මග දැක්වීම සඳහා ප්‍රදර්ශන නාම පුවරුවක් ගාලුපාර අසල සංඝරාජ මාවත ආරම්භයේ සවි කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **ශ්‍රී විජයාරාම විහාරස්ථානය දක්වා වූ දුර ප්‍රමාණය හා ගමන් මග දැක්වෙන නාම පුවරුවක් ගාලුපාර අසල සංඝරාජ මාවත ආසන්නයේ සවිකිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:5** **‘** අම්බලන්ගොඩයෝ ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කර ගැනීම සම්බන්ධවයි **’** මැයෙන් අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ පෙරදිග සංගීත උපගුරු එම්. වී. ෂචින් ක්‍රිෂාන්ත මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014-03-25 දින සවස 6. 30 ට එළිදැක්වීමට නියමිත අම්බලන්ගොඩයෝ ප්‍රසංගය අම්බලන්ගොඩ නගරය මූලික කොට ගෙන ඉදිරිපත් කරන්නාවූ ප්‍රසංගයක් බවත් තමා සහ දේවානන්ද විද්‍යාලයේ ගුරුවරියන් දෙදෙනකු විසින් අප විද්‍යාල දෙකෙහි විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබා සිටින මෙන්ම වත්මන් සුවිශේෂී දක්ෂතා ඇති සිසුන් සමූහයකගේ දක්ෂතා එළි දැක්වීමට කටයුතු යොදා ඇති බවත් මෙම ප්‍රසංගය ලාභ ඉපයීමේ අරමුණින් තොරව කරනු ලබන ප්‍රසංගයක් බවත් මින් ලැබෙන ආදායම වත්මන් විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබන සංගීත සිසුන් සඳහා පදනමක් ඇති කිරීමට යොදා ගන්නා බවත් එම නිසා මෙම ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☛ **"අම්බලන්ගොඩයෝ" ප්‍රසංගය විනෝද බදු මුදලින් නිදහස් කිරීමට සහා අනුමැතියට යටත්ව අවසර ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:6** ' අභාවප්‍රාප්ත බී. එච්. එච්. විමලදාස මැතිතුමා වෙනුවෙන් අවමංගල ස්තුතිය ' මැයෙන් විමලදාස මැතිනිය සහ පුතුන් දෙදෙනා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඉහත අවමංගල්‍ය අවස්ථාවේදී අප නිවසට පැමිණ ශෝකය ප්‍රකාශ කල නගරාධිපතිතුමා ඇතුලු මන්ත්‍රී මඩුල්ලටද නගර සභා කාර්ය මණ්ඩලයටද තම ගෞරවාදර ස්තුතිය පුද කරන බවත් පුටු සහ සුදු කොඩි ලබා දීම ඇතුලු නන් අයුරින් දක්වන දලද සහයෝගයට නගර සභාවේ සියලු දෙනාට ස්තුතිය පුද තරන බවත් විශේෂ ශෝක ප්‍රකාශ එවීම සම්බන්ධව නගරාධිපතිතුමා සහ පුස්තකාල සේවක මණ්ඩලයටද කෘතඥතාවය පල කරන බවත් දන්වා තිබුණි.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඇත්තටම මෙතුමා විශාල වශයෙන් පුස්තකාල කමිටුවට අවුරුදු 20 කට වැඩි කාලයක් එක දිගට සහභාගි වෙලා උපදෙස් ලබා දීපු තැනැත්තෙක්. අපේ සභාවෙ ශෝකයත් ඒ සම්බන්ධයෙන් දන්වා යවන්න.

<u>තීරණය</u>

☛ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී. තවද අභාවප්‍රාප්ත බී. එච්. එච්. විමලදාස මැතිතුමා වෙනුවෙන් ගරු සභාවේ ශෝකය ප්‍රකාශ කල යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය. ඒ බව විමලදාස මැතිනිය සහ පුතුන් දෙදෙනා වෙත දන්වා යැවීමටද සභාව තීරණය කරන ලදී.**

**12:7** ' සහනදායී ගාස්තුවක් යටතේ නගර ශාලාව වෙන් කර ගැනීම පිළිබඳවයි ' මැයෙන් උපුල් වීරසිංහ මහතා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

උපුල් මාමා වන තමා විසින් පෙර පාසල් දරු දැරියන් වෙනුවෙන් 2014 මැයි මස 09 දින පෙ. ව. 8.30 සිට 11.30 දක්වා නාට්‍යයක් ප්‍රදර්ශනය කිරීමට බලාපොරොත්තු වන බවත් ඒ සඳහා නගර ශාලාව සහනදායී මිල ගණනක් යටතේ ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **උපුල් මාමා විසින් ඉදිරිපත් කරනු ලබන නාට්‍ය සංදර්ශනය සඳහා නගර ශාලා ගාස්තු 50% ක මුදලක් නිදහස් කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:8** ' 2014 පෙබරවාරි මස වාර්තාව ' මැයෙන් ආයුර්වේද වෛද්‍ය නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ආයතනය විවෘතව තැබූ දින ගණන 05 ක් බවත් පැමිණි රෝගීන් සංඛ්‍යාව 77 ක් බවත් රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය ගණන 15 ක් බවත් මාසය වෙනුවෙන් ඖෂධ සඳහා වැයවූ මුදල රු. 10046.70 ක් බවත් එක් රෝගියෙක් සඳහා වැයවූ මුදල රු. 130.47ක් බවත් සඳහන් කර තිබුණි.

**තීරණය**

☛ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:9** ' 2014 ජනවාරි මස වාර්තාව ' මැයෙන් ආයුර්වේද වෛද්‍ය නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ආයතනය විවෘතව තැබූ දින ගණන 07 ක් බවත් පැමිණි රෝගීන් සංඛ්‍යාව 88 ක් බවත් රෝගීන් පැමිණීමේ දෛනික් සාමාන්‍ය ගණන 13 ක් බවත් මාසය වෙනුවෙන් ඖෂධ සඳහා වැයවූ මුදල රු. 12420.22 ක් බවත් එක් රෝගියෙක් සඳහා වැයවූ මුදල රු. 141.14ක් බවත් සඳහන් කර තිබුණි.

**තීරණය**

☛ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:10** ' 2014 වර්ෂයට උත්සව අත්තිකාරම් ගෙවීම ' මැයෙන් ගණකාධිකාරිතුමා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභා නිලධාරී/ සේවක මහත්ම මහත්මීන්ට 2014 උත්සව අත්තිකාරම් ගෙවීම සඳහා රු. 799000/- ක මුදලක් අවශ්‍ය බවත් 2014-03-26 දිනට භාණ්ඩාගාර බිල්පත් වල සේවක ණය ගිණුමේ රු. 885000/- ක මුදලක් ආයෝජනය කර ඇති බවත් එම මුදල ඊට අදාල පොළිය සමග 2014-03-31 දිනට නගර සභා සේවක ණය ගිණුමට ලබා ගැනීමට අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☛ **උත්සව අත්තිකාරම් ගෙවීම සඳහා භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර ඇති රු. 885000/- ක මුදල සහ ඊට අදාල පොළිය ලබා ගැනීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:11** ' අම්බලන්ගොඩ වෙසක් කලාපය සඳහා අනුග්‍රහය ලබා ගැනීම සම්බන්ධවයි ' මැයෙන් අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමයේ ලේකම් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

වෙසක් පුන් පොහොය නිමිත්තෙන් අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමයේ මූලිකත්වයෙන් අම්බලන්ගොඩ ප්‍රධාන මාර්ගය ආවරණය වන පරිදි වෙසක් කලාපයක් නිර්මාණය කරන්නට සැලසුම් කර ඇති බවත් 2014 මැයි මස 14, 15, 16, 17, 18 යන දිනයන්හිදී වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇති අතර ඒ සඳහා නගර සභාව විසින් පහත ඉල්ලා ඇති අනුග්‍රහයන් ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

1. 2014-05-16 හා 17 දෙදින දහම් පාසල්වල ළමුන්ගේ භක්ති ගීත සංදර්ශනය සඳහා බස් නැවතුම්පොල ඉදිරිපිට ත්‍රිවිල් රථගාල ආශ්‍රිත භූමිය, වේදිකාව (20X20), ශබ්ද විකාශය සඳහා බපල්, වේදිකා සඳහා විදුලි ආලෝකය, ප්ලාස්ටික් පුටු 250 ක් ලබා ගැනීම.

2 2014-05-13 සිට 2014-05-19 දක්වා බෞද්ධ ධජ එල්ලීම සඳහා යකඩ පයිප්ප 100 ක ප්‍රමාණයක් හා එම කොඩි නගර සීමාවේ ප්‍රධාන පාරේ සිටුවා ගැනීම සඳහා සේවක ශ්‍රමය

3 වෙසක් කලාපයට ඇතුල් වන වෙසක් කලාපයේ පිවිසුම් දොරටු දෙක සඳසා තොරණ් දෙකක් සකස් කර දීම

4 2014- 05- 15 දින ප. ව. 1.. 00 සිට 6. 00 දක්වා වීථි සංචාරය කෙරෙන සංස්කෘතික සංදර්ශන මහා පෙරහැරේ ප්‍රචාරක රථය සඳහා නගර සභාවේ කැබ් රථය ලබා ගැනීම

**ඉහත ලිපියෙන් ඉල්ලා ඇති ඉල්ලීම් ලබා දිම සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

<u>**තීරණය**</u>

☛ **ඒ අනුව තරුණ බෞද්ධ සංගමය විසින් වෙසක් කලාපය වෙනුවෙන් ඉල්ලා ඇති අනුග්‍රහය ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:12** **‘** නගර සභා වාහන සර්විස් කිරීමට වැඩ බිමක් ආරම්භ කිරීම සඳහා වන ව්‍යාපෘති වාර්තාව **’** මැයෙන් වැඩ අධිකාරී මහතා විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

නගර සභා වාහන සර්විස් කිරීමට වැඩ බිමක් ආරම්භ කර තිබුනද කාර්ය සාධන තරගාවලියේදී ලකුණු ලබා දීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කොට අනුමත කර තිබිය යුතු බවත් එම නිසා ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති වාර්තාව සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>**තීරණය**</u>

☛ **නගර සභා වාහන සර්විස් කිරීමේ වැඩ බිමක් ආරම්භ කිරීම සඳහා වන ව්‍යාපෘති වාර්තාව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:13** **‘** අ. ම. කරුණාරත්න දෙටු පුරවැසි පියසට ප්‍රවේශ වන මාර්ගය අ. ම. කරුණාරත්න මාවත ලෙස නම් කිරීම **’** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

අ. ම. කරුණාරත්න දෙටු පුරවැසි පියසට ප්‍රවේශ වන මාර්ගය අ. ම. කරුණාරත්න මාවත ලෙස නම් කිරීම සඳහා 2012-12-04 දින මාසික සභාවේ ගත් තීරණය පරිදි එම මාර්ගය නම් කිරීමේ නිවේදනය 2013-12-20 දිනැති අංක 1842 දරණ - IV (ආ) වැනි කොටස (පළාත් පාලන) ගැසට් පත්‍රයේ භාෂාත්‍රයෙන් පලවී ඇති බවත් සභාව දැනුවත් කිරීම සඳහා යොමු කරන බවත් දන්වා තිබුණි.

<u>**තීරණය**</u>

☛ **අ. ම. කරුණාරත්න දෙටු පුරවැසි පියසට ප්‍රවේශ වන මාර්ගය “ අ. ම. කරුණාරත්න මාවත ” ලෙස නම් කිරීම සඳහා වූ ගැසට් නිවේදනය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:14** **'** හල්වතුර යෝජනා ක්‍රමයේ ඇළ කණ්ඩිය මතින් පාරක් ඉල්ලීම **'** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

"පෝරුක් ඇලට යාබදව පිහිටි ඉඩම් තිරුව සම්බන්ධවයි" මැයෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මගින් යොමු කරන ලද 2014-02-26 දිනැති ලිපියට අදාල ගොනුව ඉදිරිපත් කරන බවත් එම ස්ථානයේ ඉඩම් කිහිපයක් ප්‍රවේශ මාර්ගයක් ලෙස භාවිතා කිරීමට අවසර ලබා දීමට 2746/L අංක දරණ නඩුවේදී සමථයකට පත් වී ඇති බවත් නමුත් එම ස්ථානයේ ඉඩම් කොටසක් විද්‍යාල මාවත යහසාධක සංගමයේ ඉල්ලීමකට අනුව ගොඩනැගිල්ලක් සෑදීම සඳහා ලබා දීමට 2013-12-03 දිනැති මාසික සභාව තීරණය කර ඇති බවත් නගර සභාවට ඉඩම් කොටසක් පවරා දී ඇත්තේ ඉහත නඩුවේ සමථය පරිදි කටයුතු කිරීමට බැවින් වෙනත් කටයුත්තකට එම ඉඩම් යොදා ගැනීම අත්හිටුවන ලෙසඑ ම ලිපියේ දක්වා ඇති බවත් නගර සභා ආඥා පනතේ 36(ඉ) (1), (11) වගන්ති පිළිබඳව ද අවධානය යොමු කොට ඉදිරි කටයුතු සඳහා උපදෙස් ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේකට නීතිඥ උපදෙස් අරගෙන වැඩ කටයුතු කරන්න. අපි මෙතනින් පාරක් දෙන්න විරෝධයක් නොතිබුනා මිස පාරක් හදනව කියන්න අපිට බැහැ. ඒක ඉඩම් ගොඩ කිරීම සතු කාර්යයක්. පාර හදන්න අපට සල්ලි තියෙන්න එපැයි. අපි කියන්නෙ එතනින් පාරක් දෙන්න අපි විරුද්ධ නැහැ කියන එකයි. නැතුව පාරක් හදන්න බල කරන්න අපට නියෝග ගන්න බැහැ. ඒ නිසා නීතිඥ උපදෙස් අරගෙන කටයුතු කරන්න.

<u>**තීරණය**</u>

☛ **මේ සම්බන්ධයෙන් නීති උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:15** **'** තල්ගස්ගොඩ පුංචි පාලම අසල සිට මහ පාලම දක්වා මාර්ගය අයිනේ ශරීර සුවතා මංතීරු ඉදි කිරීම - ගිවිසුම් කාලය දීර්ඝ කිරීම **'** මැයෙන් ඞී. කේ. එස්. බිල්ඩර්ස් විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාව සමග ගිවිසුම් ගතව ඉටු කරනු ලබන ඉහත කර්මාන්තය වැසි සහිත කාලගුණ තත්වය නිසා නියමිත දිනයට නිම කිරීමට නොහැකි වූ බවත් මෙම කර්මාන්තය සඳහා තව දින 45 කින් කාලය දීර්ඝ කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**</u>
සභාපතිතුමනි මෙම කර්මාන්තය නිසා තල්ගස්ගොඩ මාර්ගයේ පිපිරීම් ඇති වෙලා තියෙන්නෙ. එක පැත්තක් පාර බැහැල තියෙන්නෙ.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>
සභාපතිතුමනි ඔය පාර කොහොමත් බැහැල තිබුනෙ. මම යන්නෙ ඔය පාරෙනෙ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**</u>

එහෙම කියන්න එපා. මමත් ඔය පාරෙ යනවා. ඒකට මොකක්හරි විසඳුමක් ගන්න. කාගෙන්ද මේ අලාභය අය කරන්නෙ. මාහා මාර්ග දෙපාර්තමේන්තුව සතුව තියෙන පාරක් මේක.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි ඔය පාර කලිනුත් බැහැල තිබුනෙ. අපි මේ කර්මාන්තය සම්පූර්ණම මාර්ග සංවර්ධන අධිකාරියේ අවසරය ලබාගෙන ප්‍රධාන අමාත්‍යතුමාගෙ ප්‍රතිපාදන මත කරේ. පාර ඔතන අපි හැරුවෙ නැහැ. පස් දාල තැලුව එක විතරයි කරේ. මහ රෝලකිනුත් නෙමෙයි පොඩි රෝලක් තමයි පාවිච්චි කරේ. ඒ නිසා මම හිතන්නෙ නෑ මේක ඒ නිසා බැස්සයි කියලා. තමුන්නාන්සෙත් මේකට කැමි වෙන්න ඕනෙ. අපි මේක සම්පූර්ණ අවසර අරගෙන කරල තියෙන්නෙ.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

මම කිව්වෙ සභාපතිතුමා අවසර ගත්ත නැති කතාවක් නෙමෙයි. මේකෙන් විශාල පාඩුවක් වෙලා තියෙනව පාරට. ඒ පාඩුව කාගෙන්ද අයකර ගන්නෙ කියලයි මම ඇහුවෙ. මම මේකෙ කොන්ත්‍රාත්කරු කවුද කියලවත් දන්නෙ නැහැ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි මම මේ කර්මාන්තය ගැන කතා කරන්නෙ මේ කර්මාන්තය කරේ මම නිසයි. මම සභාපතිතුමනි වෘත්තියෙන කොන්ත්‍රාත් කරුවෙක්. තමුන්නාන්සෙට බැහැ ඒක නවත්තන්න. මම තමුන්නාන්සෙට අභියෝග කරනව තමුන්නාන්සෙට පුලුවන්නම් තමුන්නාන්සෙ කරන රැකියාවෙන්න අයින්වෙන්න ලියුමක් දෙන්න. මම කොන්ත්‍රාත් කරන එක නවත්තන්නම්. මේ ව්‍යාපෘතිය සභාපතිතුමා මම ආරම්භ කරපු ව්‍යාපෘතියක්. සියලු තැන්වලින් අවසර අරගෙන මේ ව්‍යාපෘතිය ආරම්භ කරේ. තමුන්නාන්සේලාට වසර ගණනාවකට යම් ව්‍යාපෘතියක් කර ගන්න බැරි වුනහම තමුන්නාන්සේලා ඉතින් අපට මොකක්හරි කියනවා.

**තීරණය**

☛ **වැඩ අධිකාරී නිර්දේශය පරිදි මෙම කර්මාන්තයේ කාලය දීර්ඝ කිරීමටත් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගෙන් වාර්තාවක් ලබා ගැනීමටත් සභාව තීරණය කරන ලදී.**

✪ වෙනත් කරුණු

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමනි 1 වන වසරට ළමුන් ඇතුලත් කිරීම සම්බන්ධව යවපු ලිපිය යොමු කරල තියෙන්නෙ අදාල තැනට නෙමෙයි. මානව හිමිකම් එකටයි යොමු කරල තියෙන්නෙ. මම පුවත්පතක දැක්ක ජනාධිපතිතුමා ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ගෙ රැස්වීමෙදි මන්ත්‍රීවරු කීප දෙනෙක් පළමු රැස්වීමට ළමුන් ඇතුලත් කිරීම සම්බන්ධව ප්‍රශ්න කරල තිබුණ. ඒ වෙලාවෙ ජනාධිපතිතුමා අධ්‍යාපන අමාත්‍යතුමාට කියල තිබුන මේ සම්බන්ධව කොමිටියක් පත් කරන්න කියල. ඒ කමිටුව දැන් මේ සංශෝධන භාර ගන්න පුලුවන්. ඒ නිසා මම ලේකම් තුමාට කියා සිටිනව මේ යවපු ලියුමම අධ්‍යාපන අමාත්‍යාංශෙට ඉක්මනින්ම යවන්න කියල මම ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒක අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කරන්න.

**තීරණය**

මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යවන ලද ලිපියම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යැවීම සුදුසු බවට සභාව තිරණය කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි සෞඛ්‍ය කමිටු වාර්තාවෙ සමහර තිරණ අරගෙන තියෙනවා මාසික සභාවෙදි සාකච්ඡා කිරීමට කියල. ඒ පිළිබඳව නිලධාරීන් කවුරුවත් පැමිණිලත් නැහැ. න්‍යාය පත්‍රයෙත් නැහැ. මේකෙ තියෙනවා පස් සම්බන්ධ ප්‍රශ්නයක්. ඒකට තිරණයක් මහා සභවෙදි ගන්නව කියල තියෙනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේකෙ ගෙවීම් කරලද තියෙන්නෙ. එහෙම නම් ඉතින් නිලධාරීන් වග කියන්න ඕනෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මෙතන ලොකු ගැටලුවක් තියෙනවා. රතු පස්වත් නෙමෙයි මෙතන තියෙන්නෙ. පී එච් අයි මහත්මය පුලුවන්ද නිර්දේශයක් දෙන්න පස් සම්බන්ධව. එහෙමනම් වැඩ අධිකාරී මහත්මය නිර්දේශ කරන්න ඕනෙ.

**<u>තීරණය</u>**

මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා නිවැරදි පිළිතුරක් ලබා දීමට සභාව තිරණය කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි සෞඛ්‍ය කමිටු වාර්තාවෙ තියෙනවා ටී. එච්. ඩබ්ලිව්. නිවාස ව්‍යාපෘතියෙහි පොදු වැසිකිළි වල හිස් කිරීම සඳහා රු. 30000/- ක පමණ මුදලක් වැය වන බවත් එම මුදල දැරීමට ඒ අය අකමැති බවත් ඒ සම්බන්ධයෙන් තිරණයක් ගැනීමට සභාවට යොමු කරන ලෙසත් දක්වල තියෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා මමත් එතනට ගිහිල්ල බැලුවා. අපේ පී. එච්. අයි. මහත්තයත් ගිහිල්ල බැලුව. එතන ඇත්තටම හරිම කණගාටුදායක තත්වයක් තියෙන්නෙ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභාව එකගනම් ඒක හිස් කරන්න ඒක කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි එහෙමනම් අනිත් ඒවත් කරල දෙන්න ඕනෙ. ධම්මකුසල මාවතේ තියෙනව නිවාස යෝජනා ක්‍රමයක්. එහෙම නම් අපිටත් ඒ දේ කරන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමා සභාව ගන්න තීරණයකට මමත් එකගයි. එහෙම නම් ඒ අයට කියන්න ඕනෙ තනි තනිවම වල හදා ගන්න කියලා. නැත්තම් මේක විශාල ගැටලුවක්. ඒ පළාතට යන්න බෑ. මේ මිනිස්සු කලින් දෙසැරයකට සල්ලි එකතු කරල මේ දේ කර ගත්තා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අනිත් අයත් සල්ලි එකතු කරල තමයි මේ දේ කරගන්නෙ. එතකොට ඒ අය අහනව ඇයි එක් පාර්ශවයකට පමණක් සභාවෙන් කරේ කියලා. මේකෙ ඇත්ත තත්වෙ මොකක්ද උප සභාපතිතුමා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමා මෙතන ගෙවල් පේලි දෙකේ වැසිකිළි වලවල් දෙකක් තියෙනවා. ඒ දෙක උතුරනවා. ඒ හරිය සම්පූර්ණයෙන්ම ඒ උතුරන ජලයෙන් පිරිල තියෙන්නෙ. යන්නවත් බැහැ. හරිම ගඳයි. මම ගිහින් බැලුව නිසයි මම මේ කියන්නෙ. සභාව ගන්න තීන්දුවක් ගන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්**

සභාපතිතුමනි උප සභාපතිතුමා සත් භාවයෙන් තමයි මේක යෝජනා කරේ. නමුත් ඔහොම කරන්න ගියොත් තවත් නිවාස සංකීර්ණ තියෙනවා. ඒවගෙනුත් ඉල්ලුවොත් ඒවටත් දෙන්න වෙනවා. මේක පූර්වාදර්ශයක් වෙන්න පුලුවන්. මේකට මොකක් හරි පියවරක් ගන්න. මොකද පරිසරයට හානියක් වෙන්න දෙන්නත් බැහැ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි මේකට වෙන පිළියමක් කරමු.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමා දෙන තීන්දුව දෙන්න.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හැමෝටම දීල තියෙන පොදු තීන්දුව තමයි දෙන්න වෙන්නෙ. එතකොට සල්ලි බදින්න වෙනවා. අපි බලමු මේකට මොකක්හරි කරන්න. මොකද මෙතන ඉන්නෙ යමක් කරගන්න බැරි අය. නඩත්තුව වුනත් හරිම අඩුයි. අපි අතින් හරි එකතු කරල මේක කරමු.

**තීරණය**

**මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා ලවා ස්ථානීය පරීක්ෂණයක් සිදු කොට තීරණයක් ගැනීමට සභාව තීරණය කරන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේ වාර්තාවෙ තියෙනවා ධීවර වරායෙ අපද්‍රව්‍ය යොදා ගෙන ජීව වායුව නිපදවීම පිළිබඳවත් මේ සභාවෙදි කතා කරන්න තමයි තිරණය වෙලා තියෙන්නෙ.

**තීරණය**

**මේ සම්බන්ධයෙන් ඉදිරියේදී තිරණයක් ගැනීමට සභාව තිරණය කරන ලදී.**

ප. ව. **12.00** ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

භාරත සමරසේකර,
ලේකම් ,
අම්බලන්ගොඩ නගර සභාව.

ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප්,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2014 – 04 – 30 දින,**
**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**